***2016නොවැම්බර් මස 08අඟහරුවාදා දින***

*2016 நவம்பர் மாதம் 08ஆம் திகதி செவ்வாய்க்கிழமை*

***Tuesday 10th November 2016***

ගරුනියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவபிரதித்தவிசாளர் – உதயகாந்த குணதிலக அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.D.ChairmanUdayakantha Gunathilaka preside the Chair

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*** *Hon.D.Chairman Udayakantha Gunathilaka* ----------------
------------------------------------------

සියළුදෙනාටම සුභ උදෑසනක්, සුභ දවසක් ප්‍රාර්ථනා කරනවා. නොවැම්බර් මස 08 වෙනි දින, එනම් අද දින සභාව පැවැත්වීම සඳහා අපේ ගරු ඇමතිතුමන්ලා, ඒ වගේම අපේ ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා, ඒ වගේම අපේ සභානායකතුමා, විපක්ෂනායකතුමා, විපක්ෂයේ සංවිධායකතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය අපේක්ෂා කරනවා. ඒ වගේම න්‍යාය පත්‍රානුකූලව පළමුව තිබෙන්නේ,

**අභිනව මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රතිඥා හෝ දිවුරුම් : නැත.**

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ : නැත.**

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා.
ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා.
ගරු මන්ත්‍රී ඉමිටියාම් කාදර් මැතිතුමා.
ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*** *Hon.D.Chairman Udayakantha Gunathilaka* ----------------
------------------------------------------

ඒ සියළුදෙනාගේ නිවාඩු අනුමත වෙනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම : නැත**

**කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත**

**පෙත්සම් : නැත**

**ප්‍රශ්න : නැත**

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ : නැත**

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :**

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*

*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*

*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------

මේ යටතේ ගරු ආණ්ඩු පක්ෂ සංවිධායක හර්ෂ සියඹලාපිටිය මැතිතුමාට අවස්ථාව ලබාදෙනවා.

*ගරු ආ.ප.සංවිධායක හර්ෂ සියඹලාපිටියකௌரவ*
*அரச.க.அமைப்பாளர் ஹர்ஷ சியம்பலாபிடிய*

*Hon.Gov.Whip Harsha Siyambalapitiya*-------------------------------------------------------

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට පුද්ගලිකව ප්‍රශ්නයක් පැණනැගුනා පසුගිය සති අන්තයේ. සෙනසුරාදා දිනයේ මට ලියා පදිංචි තැපෑලෙන් ලියුමක් ආවා සබරගමුව පළාත් සභාවේ නීති නිළධාරීතුමියගෙන්. ඒ ගැනයි මම මේ සභාවේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටින්නේ. එන්තරවාසියක් එවලා තියනවා. ඔබතුමන්ලා සියළුදෙනාම දන්නවා අපි පළාත් සභාවේ මන්ත්‍රීවරු හැටියට අපට අවශ්‍ය පරිගණක, ෆොටෝකොපි මැෂින්, ප්‍රින්ටර්ස් ඒවා ඒ අවශ්‍ය දේවල් ලබා ගැනීමට පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් අපි දිවුරුම් දුන්නම අපට ණය මුදලක් ලබාදෙනවා ඒ කාල සීමාවේ පටන් ගන්නකොට. ඒක අපේ ලැබෙන දීමනාවෙන් මාසිකව කපා ගන්නවා. පසුගිය 2008, 2012 කාල සීමාවේ මේක ලබාගන්නකොට අපි ඒකට ඇස්තමේන්තු එහෙම සැපයිය යුතුයි. ඊට අමතරව පළාත් සභාවේ ඉන්න තව මන්ත්‍රීවරු දෙදෙනෙක් අපට ඇප වශයෙන් අපි අත්සන් කරනවා.

මම මගේ ණය මුදල ලබාගන්නකොට මට හිතවත් මන්ත්‍රීවරු දෙදෙනෙක් අත්සන් කළා. ඒ වගේ පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙකුට මමයි තවත් හිටපු මන්ත්‍රීවරයෙකුයි අත්සන් කළා. නමුත් අවාසනාවකට ඒ ණය මුදල ලබාගත්ත මන්ත්‍රීතුමාත්, අනෙක් අත්සන් කරපු මන්ත්‍රීතුමාත් දෙදෙනාම 2012 තිබුණ පළාත් සභා මැතිවරණයෙන් ඔවුන්ට පළාත් සභාවට ඒමට වාසනාව තිබුනේ නෑ. නමුත් අපේ තිබුණ කාලය, අවුරුදු 5 ගෙවෙන්න ඉස්සර වෙලා පළාත් සභාව විසුරුවා හැරපු නිසා ඒ එක මන්ත්‍රීවරයෙකුගේ ණය මුදල 138,372/- ක මුදලක ශේෂයක් ඉතිරි වුනා. ඉතින් මම හිතන්නේ සභා ලේකම් කාර්යාලයෙන් ලියුම් පිට ලියුම් ඒ මන්ත්‍රීතුමාට යැව්වා ඒ මුදල ලබාදෙන්න කියලා. ඒ ලියුම්වල පිටපතුත් මට ලැබුණා ඇපකාරයෙක් හැටියට. නමුත් ඒ මන්ත්‍රීතුමා ඒකට ප්‍රතිචාරයක් දක්වලා නෑ. ඊට පසුව සභාව නියෝජනය කරන එක ඇපකාරයෙක් හැටියට මට ලැබෙන දීමනාවෙන් එක දවසක්, මගේ දීමනාව බැංකුවට බැර කරලා තියෙන්නේ. ඒක බැංකුවට බැරි කරපුවාම කෙටි පණිවිඩයක් එනවා. ඒ කෙටි පණිවිඩය ආවේ වෙනදා ගාණට වැඩිය අඩුවෙන්. ඉතින් මම සභා ලේකම් කාර්යාලයට කථා කරලු ඇහුවාම කිව්වා සභා ලේකම්තුමා ඔබතුමා ඇපකාරයෙක් හැටියට ඉන්න නිසා ඔබතුමාගේ කොටස අර හිඟ මුදලෙන් භාගයක් අය කරගන්න සභා ලේකම් කාර්යාලය තීන්දු කළා කියලා. මම කිව්වා හරි ප්‍රශ්නයක් නෑ, මම ඇපකාරයෙක් හැටියට අත්සන් කරලා තියනවානේ. ඒක එහෙම වෙච්ච දෙන් කියලා. මාස නවයක් රු.7000/- ගානේ මගේ දීමනාවෙන් අඩු වුනා. ඊට පස්සේ අන්තිමට 69,186/- ක්, 138,372/- න් භාගයක් මගෙන් කපාගත්තා. ඒක කපලා ඉවර වුනේ පසුගිය පෙබරවාරි මාසයේ. මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේ. ඊට පස්සේ 2016.11.02 වෙනි දින නීති නිළධාරීතුමිය

මට එන්තරවාසියක් එවනවා පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ලිපි ශීර්ෂයක මේ මුදල එවන්න කියලා සභා

ලේකම්තුමාගේ උපදෙස් පරිදි කියලා. සභා ලේකම්තුමාගේ කාර්යාලයෙන්ම තමයි මගේ ඒ කොටස කපාගත්තේ. මේකේ තියනවා එකී ණය මුදලට පළවෙනි ඇපකරු වශයෙන් ඔබ විසින් අත්සන් කර ඇත. මේක කපාගත්තා. මගේ කොටස, මගේ වගකීම කපාගත්තා. දැන් මේ කාර්යාලයෙන් මට කිව්වා නම් ඔබතුමා විතරයි මේකේ ඉන්නේ. ඉතිරි ටිකත් කපාගන්න ඕන කියලා. මම කියනවා හරි ඒ ටිකත් කපාගන්න. ඊළඟ ඡන්දයේ දී අර මන්ත්‍රීතුමාට වෙච්ච දේ මටත් වෙලා මමත් ගෙදර හිටියොත් මමත් ණය මුදලක් අරගෙන හිටියොත් කවුරු හරි ඒක, මොකද අපි සහෝදර මන්ත්‍රීවරුනේ. ඒක ප්‍රශ්නයක් නෑ. අපි අපි අතරනේ මේක වෙන්නේ. නමුත් මෙහෙම එන්තරවාසියක් එව්වාම මගේ නෝනා අහනවා, ඔයා සභාවට ගිහිල්ලා මොනවාද කරන්නේ ? මේ එන්තරවාසි එවන්නේ ඇයි කියලා. එන්තරවාසියක් එවන්නේ අපි මොකක් හරි වැරැද්දක් කරලානේ. ඉතින් මේක ආමන්ත්‍රණය කරලා තියෙන්නේ, මම තවම කෑගලු දිස්ත්‍රික්කයේ ජනතාව ඡන්ද 44,000 ක් විතර දීලා එවපු මන්ත්‍රී කෙනෙක්. මේකේ තියෙන්නේ හර්ෂ සියඹලාපිටිය මහතා. ඉතින් මේ සභාවේ කට්ටිය දන්නෙ නෑ මම තවම මේකේ ඉන්න මහජන නියෝජිතයෙක්. පළාත් සභා මන්ත්‍රීවරයෙක් කියලා. මට මහතා කියන්න ඕනත් නෑ. මැතිතුමා කියන්න ඕනත් නෑ. නමුත් මම පළාත් සභා මන්ත්‍රීවරයා කියන එක මම මං හිතන්නේ උපයා ගත්තු දෙයක්. මහජනතාව මට දුන්න දෙයක්. ඒක කාටවත් අයින් කරන්න බෑ තවම. ඊළඟ ඡන්දෙට යනකල් සැප්තැම්බර් මාසයෙන් පස්සේ. ඉතින් මෙහෙම ලියුම් එවන එක මම හිතනවා පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් අපි සියළුමදෙනා අපේ අවධානය යොමු කරන්න වෙනවා. මේක අපේ ගරුත්වයට ඒ තරම් හොඳ දෙයක් නෙමෙයි. මොකද අපි

ඇපකාරයෙක් වෙලා ඉන්නවා නම් ප්‍රශ්නයක් නෑ අපේ මුදල් කපාගත්තාට. නමුත් ඒක කරන විදිහක් තියනවා. මගේ මුදල මගේ කොටස මේකෙන් කපාගත්තා කියලාවත්

මේකේ දැනුම් දීමක් නෑ. දැන් මේ ලියුම් කවරයෙත් තියෙන්නේ හර්ෂ සියඹලාපිටිය මහතා. මේක ආමන්ත්‍රණය කරලා තියෙන්නෙත් එහෙම. මම මන්ත්‍රීවරයෙක් කියන එක මේ කට්ටියට අමතක වෙලා තියනවා. එතකොට මම සභාගත කරනවා මගේ වර්තමාන මට ලැබෙන දීමනාවේ පිටපතක්. ඒ වගේම මගේ දීමනා කපාගත්තු එකේ පිටපතක් මම සභාගත කරනවා.

ඉතින් මේක ඔබතුමා සභාපතිතුමා හැටියට මේ ගැන අපේ මන්ත්‍රීතුමන්ලාගේ ගරුත්වය ආරක්ෂා වෙන විදිහට කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මේක පෞද්ගලිකව මම නීතීඥයෙක් නෙමෙයි. නීතියේ ලේ ටිකක් ඇඟේ යනවා තාත්තා හිටපු නීතීඥවරයෙක්. හැබැයි මගේ දැනුම මේක පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකුට, අපි සියළුදෙනාටම කරන ඒ තරම් හොඳ දෙයක් නෙමෙයි කියන එක මගේ හැඟීම. බොහොම ස්තුතියි !

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ----------------
------------------------------------------

ස්තුතියි ! අපේ ගරු ආණ්ඩු පක්ෂ සංවිධායකතුමාට. ඇත්තටම එතුමා ඒ තමන්ගේ වගකීම, ඇපයක් අත්සන් කළා වගේම ඒ සම්බන්ධයෙන් තමන්ගේ වගකීමේ ඇපය සඳහා තමන්ගේ කොටස ගෙවීමට අවශ්‍ය කටයුතු කරලා තියනවා.

මේක ගෙවීම සම්බන්ධයෙන් කොතනකවත් කථා කළේ නෑ. ඒ වගකීම එතුමා ඉෂ්ඨ කළා වගේම නමුත් ඒ සම්බන්ධව අදාළ නිළධාරීන් ඒ වගකීම සහ අනවබෝධයෙන් එහෙමත් නැත්නම් සොයා බැලීමකින් තොරව තමයි

කටයුතු කරලා තියෙන්නේ. ඔහු මන්ත්‍රීවරයෙක් හැටියටවත් ඒ ලියුම යවලා නැති එක කණගාටුවට කාරණාවක්. ඒ නිසා මීට පසුව එහෙම නොවෙන්න කටයුතු සිද්ධ වෙනවා නම් හොඳයි කියන කාරණාව තමයි මතක් කරලා දෙන්නේ.

*ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.*
*கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.WhipAsoka Jayawardane*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරයෙක් අමතනකොට අපි සම්ප්‍රදායක් හැටියට නමට මුලින් ගරු කියන වචනය ඇතුළත් වෙන්න ඕන. ඒක ඇතුළත් වෙලා නෑ එතුමා අමතන ලද ලිපියේ. අදාළ කරුණට අමතරව එතුමා ඒක සඳහන් කළා. නමුත් ඇත්ත වශයෙන්ම අපි කියන්න ඕන මන්ත්‍රීවරයෙකුට ආමන්ත්‍රණය කරනකොට ගරු කියන වචනය මුලින් සඳහන් වෙන්න ඕන. ඒක අපේ සම්ප්‍රදායක්. විශේෂයෙන්ම නීති අංශය ඒක මගහැරලා තිබීම කණගාටුවට කරුණක්.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*
*கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

ගරු සභාපතිතුමනි, මට පොඩි ගැටළුවක් තියනවා මේ සම්බන්ධයෙන්.

අපේ හර්ෂ සියඹලාපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කළා එතුමා පෙබරවාරි මාසය වෙනකොට එතුමා විසින් ඒ අත්සන් කරන ලද මුදලින් භාගයක් ගෙවලා අවසන් කියලා. එතකොට මට තේරුම් ගන්න බැරි සමහරවිට

අපි ඇපකරුවෙක් වශයෙන් අත්සන් කළාම සමස්ථ මුදලට තමයි අපි අත්සන් කරන්නේ. නමුත් ඇපකරුවන් භාගයක් ගෙව්වාම එතුමාට එවැනි ලිපියක් යැවීම තුළ ගැටළුවක් මතු වෙනවා. මොකද තමන්ගේ කොටස ගෙවලා අවසන් වෙච්ච පුද්ගලයෙකුට මෙවැනි දෙයක් කිරීමේ දී අපහසුතා, මේක සමහරවිට එතුමාට හිත් රිදවීමක් සාධාරණයි. අනෙක් එක තමයි අපි ගත්තාම පෙබරවාරි මාසයෙන් අත්හිටුවලා තියෙන්නේ, ඒ කියන්නේ එතුමාට ගෙවීමට අවශ්‍යතාවයක් නෑ කියන එක. ඒ කියන්නේ එතුමාගේ අවශ්‍ය භාගය මේ වෙනකොට ගෙවලා අවසානයි. ඉන් අනතුරුව එවැනි ලිපියක් නැවත යැවීමත් වැරදියි කියන එකයි මගේ මතය. එතුමා ගෙවලා ඉවරයි. එතුමාට මෙවැනි දෙයක් කිරීම ගරු සභාපතිතුමනි, එතුමාට කරන අගෞරවයක්. මොකද මේක පූර්වාදර්ශයක් නොවිය යුතුයි. අනෙක් එක තමයි එතුමා අද මේක නිහැඬියාවෙන් මේක එතුමා තමන්ට වෙච්ච අසාධාරණය සම්බන්ධයෙන් සභාව දැනුවත් කළා. නමුත් ඇත්තම කිව්වොත් එතුමා ගෙවලා අවසන් වුනාට පස්සේ එතුමාට මෙවැනි දේවල් යැවීම මම හිතන්නේ වැරදියි. මොකද පිට කෙනෙක් නෙමෙයි යවලත් තියෙන්නේ, අපේ පළාත් සභාවේ නීති අංශයෙන්. මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකකௌரவ*
*பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman*
*Udayakantha Gunathilaka* ----------------
-----------------------------------------

එතුමාට යවන්න ඇත්තේ ලියුම ස්තුති කරලා. එන්තරවාසියක් එවලා තමන්ගේ වගකීම ඉෂ්ඨ කළාට පස්සේ.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.*

*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார Hon. Minister Ranjith Bandara* ----
---------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ ලිපියේ තියන විදිහට මේක මේ එක වගන්තියක් තියනවා එසේ හෙයින් ඉහත කී හිඟ ණය ශේෂය වන රු.138,372/- ක මුදල මෙම ලිපිය ලැබී දින 14 ක් ඇතුළත මාගේ සේවා දායකයා වෙත ලබාදී ඒ සඳහා නිසි කුවිතාන්සියක් ලබාගන්න ලෙස ඔබ වෙත දැනුම් දෙන ලෙසට මා වෙත උපදෙස් ලැබී ඇත. ඊළඟ වගන්තියේ තියනවා, ඔබ එකී ලෙසට ක්‍රියාත්මක වීමට අපොහොසත් වුවහොත් එකී හිඟ ශේෂය වන රු.138,372/- ක මුදල ද ඒ මත නෛතික පොලිය ද නඩු ගාස්තුත් සමඟ අය කර ගැනීමට. මේක පුදුම වැඩක්. මේක එවලා තියෙන්නේ සබරගමුව පළාත් සභාවේ නීති නිළධාරී, දිස්නා චන්ද්‍රසේකර කියන නීතිඥ මහත්මියක්. ප්‍රධාන ලේකම්තුමාගේ ලිපි ශීර්ෂයක් යටතේ එවලා තියෙන්නේ. සේවා දායකයා කියන්නේ පාලිත නානායක්කාර. අපේ සභා ලේකම්තුමා. උපදෙස් පරිදි ලියා දන්වනවා කියලා. එතකොට පාලිත නානායක්කාර අපේ සභා ලේකම්තුමාගේ උපදෙස් මත තමයි මේ ලියුම ඇරලා තියෙන්නේ. එතකොට මේ සභාවේ වෙන දෙයක් මම හිතන්නේ පාලිත නානායක්කාර මහත්මයා නොදැන වෙන්න විදිහක් නැහැනේ. පාලිත නානායක්කාර මහත්මයා පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුගේ ගරුත්වය ආරක්ෂා කරන්න ඉන්න සභාවේ ලේකම්තුමා. එතුමාගේ ඉල්ලීම පිට දිස්නා චන්ද්‍රසේකර කියන නීතිඥතුමිය තමයි මේක එවලා තියෙන්නේ. මම හිතන්නේ මේක හර්ෂ සියඹලාපිටිය ගරු මන්ත්‍රීතුමා එහෙම නැත්නම් අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විතරක් නෙමෙයි මේ පළාත් සභාවේ නියෝජනය කරන මන්ත්‍රිවරු 44 දෙනාම අපි සියළුදෙනාම මේ සම්බන්ධයෙන් විරෝධතාවය ප්‍රකාශකරනවා. මේක

පැහැදිලි තීන්දුවක් ගතයුතුයි. මොකද මේක පළාත් සභාවේ මහජන නියෝජිතයෙක්ට කරන අවමානයක්. මේ මුදල මන්ත්‍රීවරයා නොගෙවා හිටියා නම් ප්‍රශ්නයක්. ඒක ගෙවලත් මේ වගේ එන්තරවාසියක් එවනවා නම් මම හිතන්නේ ඉතාමත්ම, ප්‍රබල ලෙස අපි මේක හෙළාදකිනවා. ඒ වගේම මේකට වහාම නිසි ක්‍රියා මාර්ග ගන්නා ලෙස සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த Hon. Minister Athula Kumara Rahubadda* -----
---------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේක සභාපතිතුමාගෙයි, ලේකම්තුමාගෙයි වගකීමක්. මේ වතාවක් නෙමෙයි මේ දෙවෙනි වතාව. මන්ත්‍රීවරු එක වතාවක් උසාවි ගෙනිච්චා. මේ දෙවෙනි වතාව. ඒ නිසා සභා ලේකම්තුමා, තමුන්නාන්සේට මම ඉතාම වගකීමෙන් කියනවා. මේ විදිහට සෙල්ලම් කරන්න එපා තනතුරේ ඉදගෙන. තමුන්නාන්සේට ඕන ඕන දේවල් මේකේ කරන්න බෑ. ඒක මතක තියාගන්න. මේක සභාවක්. මන්ත්‍රීවරුන්ගේ අනන්‍යතාවය රකින්න ඕන සභාවේ සියළුදෙනා. ඒ නිසා මේක සාමූහික එකඟතාවයකින් එවලා තියනවා. ඒ එකඟතාවය කඩවෙලා තියනවා නම් ඒකට කටයුතු කරන්න ඕන ආකාරයක් තියනවා. ඒ නිසා තමුන්නාන්සේට ඕන ඕන විදිහට

කටයුතු කරන්න බෑ මේකේ. අනෙක් එක සියළු වගකීම් දරන්න ඕන සභාපතිතුමා මේකේ. එතුමාගේ වගකීම. කාර්යය භාරය. අධීක්ෂණය. සභාවේ ගරුත්වයක් තියෙන්න ඕන මන්ත්‍රීවරයෙකුගේ. ඒකට හානි වෙන සියළුම දේවල්වලට වගකියන්න ඕන සභාපතිවරයා. ඒ නිසා කරුණාකරලා ඔබතුමා හරි මේ වැරැද්ද අද මේ ඉදගත්ත

මොහොතේ නිවැරදි කරන්න ඕන. මේ එක එක නීති නිළධාරීන්ට ඕන ඕන විදිහට මන්ත්‍රීවරුන්ට හැල්ලු කරන්න බෑ මේ සභාවේ. ණය දෙන ක්‍රමවේද තියනවා. එහෙම නම් ඒවත් වැරදියි. ඒවාටත් මේ ඉහළ නිළධාරීන්ට දෙන්න ඕන දඩුවම්. ඒ නිසා මේ විදිහට පඩත්තර වැඩ කරන්න එන්න එපා.

*ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன Hon.Member Salitha Karunaratne* -----------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ නීති නිළධාරී කැඳවන්න අපේ කාරක සභාවකට. කැඳවලා මේ කාරණාවක් එකක් මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩකිරීම. ගරු කියන වචනයවත් දාන්න බැරි නීති නිළධාරී කෙනෙක්. අනෙක් එක නෛතික වශයෙනුත් මේ කාරණය වැරදියිනේ. මෙතුමාගෙන් අය කරන්න ඕන ප්‍රමාණය අය කරලා ඉවර වෙලා මෙතුමා කිව්වා නම් මගෙන් අය කරපු එක වැරදියි කියලා, ඒක පොඩි ගැටළුවක්. අය කරන්න ඕන ප්‍රමාණය අය කරලා ඉවර වෙලා වැඩිපුර සල්ලි ගන්න බලහත්කාරයෙන්, නීත්‍යානුකූල නොවන සල්ලි ගන්න දින 14 කින් නඩු දානවා කියලා කියනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, යෝජනා කරනවා නීති නිළධාරී අපේ කාරක සභාවට කැඳවන්න. කැඳවලා මේ පිළිබඳව විමර්ශණය කරන්න.

*ගරු මන්ත්‍රී නිමල් විජේනායක கௌரவ உறுப்பினர் நிமல் விஜேநாயகHon.Member Nimal Wijenayaka* ------------------------------------------

එන්තරවාසියක් යවන්නේ විසඳාගන්න බැරි නඩුවකට. මුලින් සාකච්ඡා

කරන්න පුළුවන්. අපේ මේ මන්ත්‍රීතුමා සෑම සභා වාරයකටම එනවා. ඉතින් මුලින් සුහදව කථා කරන්න පුළුවන්. කරන ක්‍රමයක් තියනවා. ප්‍රශ්නයක් තියනවා නම් කථා කරන්න පුළුවන්.

*ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன Hon.Member Salitha Karunaratne* -----------------------------------------------

ඉතා පැහැදිලිව තියනවා මගේ සේවාදායකයා වන සභා ලේකම් කාර්යාලයේ සභා ලේකම් ධූරය දරන පාලිත නානායක්කාර මහතාගේ උපදෙස් පරිදි ලියා දන්වන වගනම්. මේක විහිළුවක් ඇත්තටම.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* -----------------------------------------------------------

සභා ලේකම් කාර්යාලයෙන් දීපු තොරතුරුත් එක්ක තමයි නීති නිළධාරී කටයුතු කරන්නේ. එතකොට දැන් මේ වගේ මීට ඉස්සෙල්ලා වතාවකත් සිද්ධ වෙලා තියනවා. ඒ නිසා මේක මෙතනින් එහාට නොයන්න අපි ඒ අවශ්‍ය කාරක සභාවට නීති

නිළධාරීන් කැඳවලා අවශ්‍ය ඒ වාර්තාව ඊළඟ සභාවට ඉදිරිපත් කරලා මේක නිවැරදි කරලා එතනින් එහාට නොයන්න කටයුතු කරන්න කියලා මම යෝජනා කරනවා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த *Hon. Minister Athula Kumara Rahubadda* -----
------------------------------------------------

මේ වතාවක් නෙමෙයි. මේ දෙවෙනි වතාව. තවත් වතාවල් වෙලා ඇති. කාරක සභාවට ගේන්න.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக *Hon.D.Chairman Udayakantha Gunathilaka* ----------------
-----------------------------------------

කාරක සභාවට ගෙන්වලා ඊට පස්සේ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්න කියලා යෝජනා කරනවා.

මීළඟට ගරු පල්ලෙපොල මන්ත්‍රීතුමාට අවස්ථාව ලබාදෙනවා.

*ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල* கௌரவ சிரில் பல்லேபொல*Hon.Member Cyril Pallepola*
----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අමාත්‍යවරුනි, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුනි. අද දින මට පෞද්ගලික හේතුවක් මත අද අපි සබරගමුව පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට අද අනිවාර්යයෙන්ම අපි සබරගමුව පළාත් සභාවට ඇවිල්ලා ජනතාව වෙනුවෙන් සියළු ප්‍රශ්න විසඳන්න තියන දවසක අද වරකාපොල ප්‍රාදේශීය සම්බන්ධීකරණ

කමිටුවේ සම්බන්ධීකරණ රැස්වීම දාලා. මම හිතන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අපි ලිඛිතව ඇරලා තියනවා. නමුත් ඒක උපක්‍රමශීලීව සම සංවිධායකවරුන්ගේ බලපෑම් පිට හෝ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ බලපෑම් පිට අද වෙන දිනයක සම්බන්ධීකරණ රැස්වීම පවත්වනවා. අපි ආසනයේ ජනතාව වෙනුවෙන් කථා කරන්න ඕන මොහොතක මෙතන පළාත් සභාවට ඇවිල්ලා අපි ජනතාව වෙනුවෙන් කථා කරන්න ඕන. අද එහෙම රැස්වීම් පවත්වනවා. ඒක මන්ත්‍රීවරු හැටියට අපට පෙළක් වෙලාවට හිතෙනවා මොනවා හරි ටෙන්ඩර් මගඩියක් හරි, වෙන දෙයක් හරි වහගන්න මෙහෙම කරනවාද කියලා. අද වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණ රැස්වීම. මම කණගාටු වෙනවා ගරු සභාපතිතුමනි, මහජන නියෝජිතයෙක් හැටියට.

ඒ විතරක් නෙමෙයි අපි සහෝදර මන්ත්‍රීවරු හැටියට හර්ෂ සියඹලාපිටිය මන්ත්‍රීතුමාට වුන සිද්ධිය පිළිබඳවත් මම කණගාටුව ප්‍රකාශ කරනවා. ඒ විතරක් නෙමෙයි ගරු සභාපතිතුමනි, පෙළක් වෙලාවට අපි අමාත්‍යාංශ කීපයකට යනවා. යනකොට මේ වැදගත් නිළධාරීන් ඉන්නවා. එන මන්ත්‍රීවරයාට ගෞරවයක් ඇතුව සළකලා බොහොම නිහතමානීව කටයුතු කරන නිළධාරීන්, නිළධාරීතුමියන්ලා ඉන්නවා. පෙළක් අමාත්‍යාංශවලට ගිහාම

මන්ත්‍රීවරුන් තුට්ටුවකටවත් සළකන්නේ නැති අමාත්‍යාංශත් තියනවා කියන එක මතක් කරන්න ඕන. අපි මහජන නියෝජිතයෝ. කෑගල්ල දිස්ත්‍රික්කය සහ රත්නපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් මන්ත්‍රීවරු 44 දෙනෙක් ජනතාවට සේවය කරන්න ඇවිල්ලා තියෙන්නේ. එතුමාට වුන අසාධාරණය අපට අමාත්‍යාංශවලදීත් සිද්ධ වෙනවා කියන එක මම මේ අවස්ථාවේ දී මතක් කරනවා. එහෙම වෙන්න දෙන්න එපා. මේ ආණ්ඩුව යහ පාලනයක් නම් අපි

ඔක්කෝම එකට එකතු වෙලා කටයුතු කරන්න ඕන කියන එක මතක් කරනවා ගරු සභාපතිතුමනි.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக *Hon.D.Chairman Udayakantha Gunathilaka* ----------------------------------------------------------

බොහොම ස්තුතියි ! පල්ලෙපොල ගරු මන්ත්‍රීතුමනි. සභාව පැවැත්වෙන දින සම්බන්ධව ලේඛණයක් දිස්ත්‍රික් ලේකම්තුමාට යවලා කෑගල්ලේ , සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම යවලා තියනවා. එතකොට පහුගිය වතාවල් කීපයක එහෙම සභාව පැවැත්වෙන දිනවල සම්බන්ධීකරණ කමිටු පැවැත්වුවා. ඒ නිසා තමයි විශේෂයෙන්ම ඒ සම්බන්ධයෙන් සභාවේ යෝජනා කරලා තීන්දු කරලා යැව්වේ. නමුත් එහෙම තියෙද්දිත් තමයි අද වරකාපොල කොට්ඨාශයේ සම්බන්ධීකරණ කමිටුව පැවැත්වෙන්නේ නැවත වතාවක් මමත් සම්බන්ධීකරණ කමිටුවට සහභාගී වෙන්න අවශ්‍යයි ජනතාව වෙනුවෙන්. ඒ කොහොම වුනත් දිස්ත්‍රික් ලේකම්තුමාට නැවත වතාවක් මේ සම්බන්ධව සිහිකැඳවීමක් යවලා මින් මතු එහෙම නොවෙන්න කටයුතු කරන්න කියලා මම යෝජනා කරනවා.

*ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල* கௌரவ சிரில் பல்லேபொல*Hon.Member Cyril Pallepola* ----------------------------------------------------------

සභාපතිතුමනි, පොඩි නිවැරදි කිරීමක් කරන්න ඕන. අපි ඇරපු දින ටික

ඒකේ තියනවා. නමුත් ඒ දින ටික මගහැරෙන්නට අපි දාලා තියෙන්නේ මේ මාසයේ 15. ඊළඟට 29 සභාව මෙහේ. ඒ දින මගහැරෙන්නට දින ඒ කට්ටිය නියම කරගන්න ඕන. ඒකයි වෙන්නේ. අපි ඇරපු ලිස්ට් එක වෙනයි. හදන දින වකවානු වෙනයි. ඒකයි එතන වෙන්නේ සභාපතිතුමනි.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக *Hon.D.Chairman Udayakantha Gunathilaka* ----------------------------------------------------------

බොහොම ස්තුතියි ! පල්ලෙපොල ගරු මන්ත්‍රීතුමනි.

**ශෝක ප්‍රකාශ යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා :**

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக *Hon.D.Chairman*

*Udayakantha Gunathilaka* ----------------
------------------------------------------

මේ යටතේ අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல****Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්න දෙකක් තියනවා. එකක් තමයි ගරු සභාපතිතුමනි, එල්ලාවල, දෙහෙරගොඩ ප්‍රාථමික විද්‍යාලයට අමතර පන්තියක් ලබා ගැනීම. ගරු සභාපතිතුමනි, එල්ලාවල, දෙහෙරගොඩ කිව්වාම පිටිසර පළාතක්. දැන් මේ ආනන්ද, නාලන්ද, රාජකීය, සෙන්ට් තෝමස් දා ගන්න නෙමෙයි මේ දෙමව්පියෝ ඉල්ලන්නේ. ගමේ පාසල. ගමේ පාසලේ දෙහෙරගොඩ විද්‍යාලයේ ළමයි 27 දෙනෙකුට යන්න තව පන්තියක් උවමනයි කියනවා නම් මේක අනිවාර්යයෙන් කරන්න ඕන. මේක ගමේ පාසල. ඉතින් මේ නිසා ගරු සභාපතිතුමනි, අද අධ්‍යාපන ඇමතිතුමා හිටියා නම් වැදගත් වෙනවා. මම ගරු සභාපතිතුමනි මඟින් අධ්‍යාපන ඇමතිතුමාට මේක යොමු කරලා තියෙන්නේ. මොකද ලබන ජනවාරි වෙනකොට මේ ළමයි 27 දෙනාට යන්න විදිහක් නෑ, ගමේ දෙහෙරගොඩ. දෙහෙරගොඩ කණිෂ්ඨ විද්‍යාලය. මේකට වහාම පන්තියක් ලබා දීමේ කටයුත්ත කරන්න කියලා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, කිරිඇල්ල දේවරක්ඛිතය ගත්තාම ප්‍රසිද්ධම ප්‍රාථමික පාසලක්. මේ පාසලෙත් මේ ප්‍රශ්නයම වෙලා තියනවා. ගරු සභාපතිතුමනි, මේකේ විශේෂත්වයක් තියනවා මඩබද්දර කිව්වාම අල්ලපු වැට. වසම්වලින් ගත්තාම අල්ලපු වසම. නමුත් ආසනය කලවාන. ඒ වුනාට මේ මඩබද්දර පාසලේ 1 වසරට එකම ළමයයි ඉන්නේ. ඉතින් දෙමව්පියෝ මේ ළමයා අර පාසලට අරින්න අකමැතියි. එක ළමයෙක් ඉන්න පාසලට ඇරලා වැඩක් නැහැනේ. ඉතින් දේවරක්ඛිතය කියන්නේ මෙහා පැත්තේ

වසම. නමුත් ඇහැළියගොඩ ආසනයේ, කලවාන ආසයේ බවුන්ඩ්‍රිය. ඉතින් මේ ළමයි තුන්දෙනෙක් ඉන්නවා මෙතන. මේ තුන්දෙනත් එක්ක ගත්තාම 25 දෙනෙක් ඉන්නවා දේවරක්ඛිත විද්‍යාලයේ 1 වසරට. මේකෙත් 1 වසර පන්තියක් තාවකාලිකව හෝ අනිවාර්යයෙන්ම ඇරලා මේ දමව්පියන්ගේ දුවා දරුවෝ දාගන්න. දේවරක්ඛිතය කියන්නේ ඒකට ආවේනික ළමයි තමයි 22 ක් ඉන්නේ. අර තුන්දෙනත් එක්ක තමයි 25 ක් ඉන්නේ. ඉතින් අධ්‍යාපන ඇමතිතුමාට මේ ලියුම් දෙකම තියෙන්නේ. ඔබතුමා හරහා තමයි තියෙන්නේ. කරුණාකරලා ජනවාරි මාසයේ 1 වසර ළමයි බඳවා ගන්නවිට මේ දෙකම ඉටු කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලනවා ගරු සභාපතිතුමා මඟින් මේක යෝජනා කරනවා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක****கௌரவ*
*பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman*
*Udayakantha Gunathilaka* ----------------
------------------------------------------

බොහොම ස්තූතියි ! විපක්ෂයේ සංවිධායකතුමනි. ඊළඟට ඒක දැන් අපෙන් මේ ආකාරයෙන් යොමු කරනවා වගේම ලේකම්තුමාට ඒකේ ක්‍රමවේදයක් තියනවා

විදුහල්පතිවරයා ඉල්ලීම කරන්න ඕන කොට්ඨාශයෙන්. ඒ කොට්ඨාශයේ ඉල්ලීම කලාපයට ගිහිල්ලා කලාපය හරහා ලේකම්තුමාට සහ පළාත් අධ්‍යක්ෂතුමාට එවන්න ඕන. ඒ අනුව තමයි ඒ කාරණාව කෙරෙන්නේ. ව්‍යුහ කමිටුවට දාන්න ඕන. නමුත් ඒ අනුව යෝජනාව එන්න ඕන. ඒ අනුව ක්‍රියාත්මක කරලා අපේ නිර්දේශයත් අපි............

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*Hon.Opposition Whip Siripala Kiriella
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම මේක අධ්‍යාපන අධ්‍යක්ෂ, ලේකම්තුමා මේ සියළුම දෙනා දැනුවත් කරලා තියනවා. මේක තවමත් නිහඬතාවයේ තිබෙන නිසා තමයි සභාගත කරලා මේ අධ්‍යාපන ඇමතිතුමා දැනුවත් කරන්නේ.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka ----------------
------------------------------------------

සභාව තුළිනුත් දැනුම් දීම කරනවා. නමුත් අපේ සභාව තුළින් දැනුම් දුන්නාට ප්‍රශ්නය තියෙන්නේ කොට්ඨාශයෙන් සහ කලාපයෙන් නිර්දේශය නැතුවාම ව්‍යුහ කමිටුව ඒක ප්‍රතික්ෂේප කරනවා. ඒ නිසා ඒ නියම ක්‍රමවේදයකට......

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*Hon.Opposition Whip Siripala Kiriella
-----------------------------------------------------

ඒ ලිපි සියල්ලක්ම ඇරලා තියනවා. මේක මේ ඇමතිතුමා දැනුවත් කරලා කරන්න ඕන දෙයක් කියලයි ගරු සභාපතිතුමනි, මම කියන්නේ.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka ----------------
------------------------------------------

සභාව මඟින් මෙම යෝජනාවත්, නිර්දේශයත් අපි ලබාදෙන්න කටයුතු කරනවා.

*ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න* கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன Hon.Member Salitha Karunaratne ---------------------------------------------
-----

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ යම් කාරණාවක්. අද මේ එපිටවල විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ඇමතිතුමාට යොමු කරන්න ගෙනාවේ. දැන් ඇමතිතුමාත් නෑ. අමාත්‍යාංශයේ ලේකම්තුමාත් නෑ. මේක කඩිනම් අවශ්‍යතාවයක්. කිරිඇල්ල එපිටවල ප්‍රාථමික විද්‍යාලයේ 5 ශ්‍රේණියට ගුරුවරයෙක් නෑ. එතකොට එපිටවල විද්‍යාලයේ 5

ශ්‍රේණිය කියලා කියන්නේ ශිෂ්‍යත්වය සමත් දරුවන් ඉන්න, දවසින් දවස දියුණු වෙන පාසලක්. 2016 වසරේ 5 ශ්‍රේණියට ගුරුවරයෙක් නෑ කියලා කියන්නේ ස්ථිර වශයෙන්ම 5 ශ්‍රේණියේ එක්කෙනෙක්වත් ශිෂ්‍යත්වය පාස් වෙන්නේ නෑ. ඒ වේදනාවෙන් ඒ දෙමව්පියෝ බලාගෙන ඉන්නවා. ඒ නිසා නොවරදවාම 2017 වසර ආරම්භ වෙන්න ඉස්සෙල්ලා කිරිඇල්ල එපිටවල විද්‍යාලයේ 5 ශ්‍රේණියට ගුරුවරයෙක් ලබාදෙන්න මැදිහත්වීම කරන්න කියලා මේ සභාවේ යෝජනා කරනවා. හේතුව මට මේක සභාවේ කියන්න ඕන දෙයක් නෙමෙයි. අද ඇමතිතුමා හිටියා නම් හරි. අමාත්‍යාංශයේ ලේකම් හිටියා නම් හරි. දෙන්නාම නෑ. මේක කල් දාන්නත් බෑ.

ඒ හින්දා ගරු සභාපතිතුමනි, මම මේ සභාවේ යෝජනා කරන්නේ කිරිඇල්ල එපිටවල විද්‍යාලයේ 5 ශ්‍රේණියට ප්‍රාථමික ගුරුවරයෙක් ලබාදෙන්න කඩිනම් පියවර ගන්න කියලා මම මේ සභාවට යෝජනා කරනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ----------------------------------------------------------

ඒ ඉල්ලීම, යෝජනාව හෙට දවසේ ලේකම්තුමාට ලබාදෙන්න කටයුතු කරන්න කියලා මම ප්‍රකාශ කරනවා.

*ගරු මන්ත්‍රී අනුර අලගියවන්න* *கௌரவ உறுப்பினர் அனுர அலகியவன்ன* *Hon.Member Anura Alagiyawanna* ----------------------------------------

සභාපතිතුමනි, අපි මෙතන ඇවිල්ලා ඉන්නේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මාසයකට දෙපාරක් මේ ගරු සභාවේ සභා රැස්වීමට සම්බන්ධ වෙන්නේ. මෙතන ජනතාවගේ ප්‍රශ්න කථා කරන තැනක්. සබරගමුවේ යම් යම් ආයතන සම්බන්ධව ප්‍රශ්න කථා කරන තැනක්. මෙතනට පේන්නෙ නම් නෑ මේ උඩ කොටස කොහොමද කියලා. මේ කථා කරන දේවල් ගැන අවධානය යොමු කරන්න අදාළ බලධාරියෙක් මේ ස්ථානයට කැඳවලා තියන්න කියන යෝජනාව අපි කියනවා. මේක නැත්නම් මෙතන කථා කෙරුවා. අපි මෙතනින් ගියා. එච්චරයි. අපි ඕන තරම් ප්‍රශ්න කථා කරලා තියනවා. නමුත් ඒ ප්‍රශ්න එකකටවත් අවශ්‍ය විසඳුමක් ලැබුණ වෙලාවල් තියෙන්නේ බොහොම කලාතුරකින්. ඒ නිසා මේක අඩුම තරමින් අහන්න දකින්න හරි තිබිලා මේ ප්‍රශ්නයට

විසඳුමක් දෙන්න වෙනවානේ. සෑම අමාත්‍යාංශයකම මෙතනට අවශ්‍ය නිළධාරියෙක් කැඳවලා තියන්න අවශ්‍ය කටයුතු කරන්න අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ----------------------------------------------------------

ඒ සම්බන්ධයෙන් දැන් නිළධාරියෙක් කැඳවන්න වෙන්නේ අද උදේ යෝජනාව දුන්නාම නිළධාරියෙක් කැඳවන්න පුළුවන් කමක් නෑ.

*ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න* *கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன* *Hon.Member Salitha*

*Karunaratne -------------------------------------------------------*

ගරු සභාපතිතුමනි, ඒ කථාව වැරදියි. මට මතකයි රංජිත් බණ්ඩාර ගරු ඇමතිතුමා යෝජනාවක් කළා සභාව දවසට අමාත්‍යාංශවල නිළධාරින් කැඳවන්න කියන යෝජනාව. එතකොට අදාළ යෝජනාව සම්බන්ධයෙන් අදාළ නිළධාරීන් නෙමෙයි. ගරු සභාපතිතුමනි, සභා රැස්වීම දවසට අමාත්‍යාංශයේ කවුරු හරි නිළධාරියෙක් මේ සභාවේ ඉන්න ඕන. දෙන යෝජනාවට අදාළව නිළධාරීන් කැඳවන්න කියන එක නෙමෙයි. මෙතනදී කථා කරන එක මොනවාද කියලා ඒ අවස්ථාවේ දී නෙ මතුවෙන්නේ. ඒ හින්දා මට මතකයි රංජිත් බණ්ඩාර ඇමතිතුමා යෝජනා කළා සභා රැස්වීම දවසට අමාත්‍යාංශයේ නිළධාරීන් මේකට කැඳවන්න කියලා. සමහරවිට

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා අද අත්‍යාවශ්‍ය කාරණාවකට යන්න ඇති. ඒ වෙනුවට වෙන නිළධාරියෙක් කැඳවන්න පුළුවන්නේ. අඩුම ගානේ කථා කරලා මෙහෙම ප්‍රශ්නයක් තියනවා කියලා කියන්නවත්. අද කවුරුවත්ම නැහැනේ. ඇමතිතුමාත් නෑ. අධ්‍යාපන අමාත්‍යාංශයට සම්බන්ධ කිසි කෙනෙක් නෑ.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක**கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka -------------------------------------------------------*

මෙතෙක් කල් එහෙම සියළුම නිළධාරින් කැඳවලා තිබුනෙ නෑ සභාව දවසට. එහෙම ගැටළුවක්, ප්‍රශ්නයක් කලින් දීලා තිබුණා නම් ඒ අදාළ නිළධාරීන් ගෙන්වන්න පුළුවන්. නමුත් ප්‍රශ්නය තියෙන්නේ මේ යෝජනා සමහර වෙලාවට දෙන්නේ සභාව පටන් ගත්තාට පස්සේ. ඊළඟට මට ඇවිල්ලා දෙනවා මූලාසනයේ වාඩි වුනාට පස්සේ මේ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා. එතකොට අදාළ නිළධාරියෙක් ගෙන්වන්න බැරි තත්ත්වයට පත් වෙනවා. ඉතින් ඒ නිසා එහෙම නොවෙන්න අපට කල්තියා දෙනවා නම් මෙන්න මේ යෝජනාව ලේකම්තුමාට හරි බාරදෙනවා නම් දවසකට හරි කලින් එතකොට ලේකම්තුමාට පුළුවන් වෙනවා ඒ නිළධාරීන් ගෙන්වන්න. එහෙම නැත්නම්

***ගරු මන්ත්‍රී පරාක්‍රම අතාවුද** கௌரவ உறுப்பினர் பராக்கரம அதாவுதHon.Member Parakrama Athawuda ----------------------------------------*

ගරු සභාපතිතුමා, දැන් මේ සභාවේ අමාත්‍යවරු ඉන්නවානේ පස්දෙනෙක්. ඒ පස්දෙනාගේ පස්දෙනෙක් මෙතන වාඩි කරලා තිබුණා නම් අහගෙන ඉන්නවා. ඒ අමාත්‍යාංශයට අදාළ දෙයක් කතා කළා නම් ලේකම්තුමා දන්නවා. පොඩි වැඩක්. එහෙම කරන්න පුළුවන්.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස** கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச Hon.Opposition Leader W.Somadasa -------------------------------------------------------*

ඒ ඇමතිවරයා වගකියන්න ඕන සභාවේ දිනට සහභාගී නොවෙනවා නම් ලේකම්වරයෙක් එවන්න. ලේකම්වරයාත් සහභාගී නොවෙනවා නම් අදාළ නිළධාරියෙක් එවන්න. ඒක වගකීමක් වෙන්න ඕන. අපට යෝජනා කලින් දාගෙන එන්න බෑ. අපි පොදු ප්‍රශ්න කථා කරනකොට එදා දවසේ වෙන දෙයක් තමයි කථා කරන්නේ. සමහරවිට ඊයේ වෙච්ච දෙයක් අද කථා කරනවා වෙන්න පුළුවන්. එහෙම වුනොත් කොහොමද අපි මේ කටයුතු කරන්නේ. ඒක නිසා දැනුවත් කරන්න ඇමතිවරු මේකට වගකියන්න ඕන. ඇමතිවරු, ලේකම්වරු සහභාගී නොවෙනවා නම් අදාළ නිළධාරියෙක් මේ සභාවට එවන්න කියලා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* ----------------------------------------------------------

ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ යෝජනා දෙකම එකයි. ඒ නිසා මම අවශ්‍ය උපදෙස් දෙනවා මෙතනින් ඉදිරියට පැවැත්වෙන සභාවලට ඒ අදාළ නිළධාරීන් ගෙන්වන්න කටයුතු කරන්න කියලා.

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා :**

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* ----------------------------------------------------------

හර්ෂ සියඹලාපිටිය මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු ආ.ප.සංවිධායක හර්ෂ සියඹලාපිටිය கௌரவ அரச.க.அமைப்பாளர் ஹர்ஷ சியம்பலாபிடிய Hon.Gov.Whip Harsha Siyambalapitiya*-------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රධාන අමාත්‍යතුමා යෝජනා කරලා තියනවා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවලට සමගාමීව පළාත් සභාව තුළින් අපේක්ෂිත කාර්යය භාරය සඳහා අදහස් හුවමාරු කර ගැනීමේ වැඩ මුළුවක් මේ මස 11 වෙනිදා හැන්දෑවේ සිට 12, 13 දිනයන් හි පවත්වන්න කටයුතු කරලා තියනවා. මේ වැඩමුළුව

පැවැත්වීමට සභාවේ අනුමැතිය ලබාගත යුතුයි. ඒකට මේ වැඩමුළුව රජයේ ප්‍රතිපත්ති සහ සංවර්ධන වැඩ සටහන්වලට සමගාමීව පළාත් සභාව තුළින් අපේක්ෂිත කාර්යය භාරය තුළින් අදහස් හුවමාරු කර ගැනීමේ වැඩමුළුවක් 11 වෙනිදා සවස 5.00 සිට 12 වෙනිදා දවස පුරා සහ 13 වෙනිදා උදේ වරුවෙන් ඒක ඉවර වෙන්නේ. ඒකට පළාත් සභාවේ අනුමැතිය ලබාදෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර් கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார் Hon.Member M.Y.M.Iflar* ----------------------------------------

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් වැදගත්කමක් අපි දකිනවා. මොකද පළාත් සභාව තුළ අයවැයත් ඉදිරියේ දී පවත්වන්නට නියමිත බැවින් මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී අපට පක්ෂ විපක්ෂ දෙපාර්ශවයටම මේ සම්බන්ධයෙන් සහයෝගයෙන් යම් යම් අදහස් හුවමාරු කිරීම සහ දැන ගැනීමේ හැකියාව මේ තුළ පවතිනවා. මෙවැනි දෙයක් සිදුවෙනවා නම් ඉතා යහපත් කියන හැඟීම තමයි අප තුළ තිබෙන්නේ. මොකද මෙවැනි දේවල් සිදුවිය යුතුයි. මොකද අපි මේ දෙපැත්තේ ඉඳලා මොන දේ කළත් එවැනි දේවල් සාකච්ඡා මාර්ගයෙන් යම් යම් දේවල් තියන අඩුපාඩු සහ අයවැය සම්බන්ධයෙන් කථා කිරීමේ සහ සංවර්ධන උපාය මාර්ග සම්බන්ධයෙන් තිබෙන ගැටළු විසඳා ගැනීමටත් අපට අවස්ථාව තිබෙනවා. ඒ සඳහා එකඟ වන බව මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරන්න කැමතියි.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------- -----------------------------------------

ඒ අනුව සභාවේ සියළුදෙනාගේ එකඟතාවය ලබාදෙනවා මේ අවස්ථාවේ දී. ඒ අනුව ප්‍රශ්නයක් නෑ සියළුදෙනාම එකඟයි මේ කාරණාවට.

**පළාත් සභාවේ පොදු කටයුතු :** නැත

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :** නැත

**සභාව කල් තැබීම :**

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச Hon.Opposition Leader W.Somadasa* ------------ ----------------------------------------------

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා ගෙනාපු යෝජනාව වැදගත් බව ප්‍රකාශ කරන්න ඕන. විශේෂයෙන්ම අපේ මන්ත්‍රීතුමා කිව්වා වගේ මන්ත්‍රීවරුන්ට අදහස් ප්‍රකාශ කළයුතුයි අයවැයකදී. ඒ වගේම යමක් දැන ගන්න අවස්ථාවක් ලැබෙන වෙලාවක්. නවක මන්ත්‍රීවරු රාශියක් ඉන්නවා. මේ අයටත් මේ කරුණු ගැන අවබෝධයක් එනවා. ඒ නිසා මම සභාවේ එකඟත්වය ප්‍රකාශ කරනවා.

*ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා. கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன Hon.Gov.WhipAsoka Jayawardane* -------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මෙම ගරු සභාව 2016 නොවැම්බර් 21 වෙනි සඳුදා පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මම යෝජනා කරනවා. එදින ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2017 වර්ෂය සඳහා අයවැය කථාව ඉදිරිපත් කිරීමට නියමිත බව ද ගරු සභාවට දන්වා සිටින ලෙස මම ඉල්ලා සිටිනවා.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා :**

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ**

*பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* -------------------------------------------------------

මේ යටතේ ගරු රත්නායක මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක* கௌரவ**

*உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.Member K.L.Ratnayake* -------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේක පොදු කටයුතුවලටත් දාලා තිබුණා. කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමාත් කථා කරපු ප්‍රශ්නය, මම හිතන්නේ සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාත් ගෙනාපු ප්‍රශ්නයත් එක්ක ගත්තාම බරපතල කාරණාවක් තියනවා මේ සභාව දැනුවත් කළේ එතුමා දැන ගත්ත කාල පරාසය තුළ. නැත්නම් කලින් දැනගත්තා නම් යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්න තිබුණා. ඒ නිසා ගරු සභාපතිතුමනි, හැමදාමත් එක නිළධාරිනියක් නම් ඉන්නවා වාඩි වෙලා. කොයි අමාත්‍යාංශයේ ද කියන්න දන්නෙ නෑ. එතුමිය හැම සභාවකම ඉන්නවා. ඒ නිසා අනෙක් අමාත්‍යාංශවලත් ඉන්න අපේ අමාත්‍යතුමන්ලාගේ ඒ අවශ්‍ය නිළධාරීන් සභාවට සහභාගී කරන යෝජනාව ගෙනාපු එක හොඳයි කියන එක මම මතක් කරන අතරම ගරු සභාපතිතුමනි, දැන් මේ පන්තිවල මේ යහපාලන ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යවරයා විසින් පන්තියක ළමුන් 35 කළා. ඊට පස්සේ 40 කළා. හැබැයි ඊට ඉස්සෙල්ලා 50 ක් හිටියා. එතකොට ගරු සභාපතිතුමනි, 50 ක් හිටපු සංඛ්‍යාවෙන් 35 කරලා, 40 කළාම 10 කට යන එන මං නෑ. එතකොට මෙතන තියන ප්‍රශ්නය මෙහෙම 35 කරන එක හොඳයි. හැබැයි එක පාරට නෙමෙයි. පහුගිය අවුරුද්දේ 40 යි. මේ පාර 39 යි. ඒක හොඳයි. හැබැයි ගරු සභාපතිතුමනි, බරපතල කාරණාවක් තියෙන්නේ එදා ළමුන් 50 ක් හිටපු පන්තිවල 10 ක් අඩු වෙනකොට ඒ 10 ට යන්න පාසලක් නෑ. එහෙම නම් පන්තියක් වැඩි කළයුතුම වෙනවා. එහෙම නම් අපි කියන්නේ මේ දෙහෙරගොඩ විද්‍යාලයේ

1 වසර පන්තියක් වැඩි කිරීම පිළිබඳව. මෙතනදී දෙහෙරගොඩ විද්‍යාලය වෙන්න පුළුවන්, දේවරක්ඛිත විද්‍යාලය වෙන්න පුළුවන්, නැත්නම් ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය වෙන්න පුළුවන්, ඇඹපොල ප්‍රාථමික විද්‍යාලය වෙන්න පුළුවන්. ඒ විතරක් නෙමෙයි ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අර ප්‍රථමයෙන්ම කථා කරනකොට විෂයය භාර අමාත්‍යවරයා නෑ. හැබැයි හිටියත් වැඩකුත් නෑ. ඒ නිසා සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා කිව්වේ 5 වසරට ළමයෙක් අඩුයි. මේක කඩිනමින් කරන්න ඕන කියලා. මෙතුමා දැනගෙන හිටියා නම් අද වෙනකොට වෙන්න පුළුවන්. ඊයේ වෙන්න පුළුවන්. සෙනසුරාදා, ඉරිදා වෙන්න පුළුවන් මෙතුමා දැනුවත් කරනකොට. පන්ති දෙකක් තියනවා. ළමයි 80 කගේ නම් ලැයිස්තුවක් තියනවා. එතකොට පන්තියක් වැඩි කළයුතුමයි. ඒ වගේම තමයි දේවරක්ඛිත ප්‍රාථමික විද්‍යාලයෙත් ඒ ආකාරයටම තියනවා. ජනප්‍රිය පාසල්වලට යන්න දෙමව්පියෝ හැම කෙනෙක්ම කැමතියි දරුවා යවලා හොඳ අධ්‍යාපනයක් ලබාදෙන්න. හැබැයි දළු කඩන, කිරි කපන සාමාන්‍ය දෙමව්පියන්ගේ දරුවෝ තමයි ඔය පාසල්වලට යන්නේ. හැබැයි කෝටිපතියන්ගේ, ලොකු මිනිස්සුන්ගේ දරුවෝ යන්නේ කොළඹ නැත්නම් සීවලිය, එහෙම නැත්නම් ඇහැළියගොඩ ජාතික පාසල වෙන්න පුළුවන්. හැබැයි මුදලට සහ ඉහනුමට ඒවා ගියත් වැරදි අර්ථ කථනය

තියෙන්නේ අහිංසක දුගී දුප්පත් දෙමව්පියන්ගේ දරුවන්ට වෙන අසාධාරණය. අනිවාර්යයෙන්ම පන්තියක් වැඩි කළයුතුයි. ඇරැපොලත් එහෙමයි. ඇරැපොල මම කියන්න ඕන 1 වසර ආරම්භ කරන්න මේ සභාවට ආවාට පස්සේ අවුරුදු දෙකක් ගෙදර ඉඳලා ආවාට පස්සේ තර්ක විතර්ක ගෙනාවා. හැබැයි එදා ද්විතීක පාසල් දහස හදනකොට 1-5 අයින් කළා. එහෙම අයින් කරපු පාසල් අතරින් එකක් තියනවා උඩුවක සිද්ධාර්ථ විද්‍යාලය අද වැහීගෙන යන තත්ත්වයට පත්වෙලා හමාරයි. එතකොට මේ ද්විතීක පාසල් දහසේ ඔන්න ප්‍රගතිය. එතකොට අපි අහනවා මේ 1 වසර ආරම්භ කළා ඇරැපොල විද්‍යාලයේ. ඇරැපොල විද්‍යාලයේ ආරම්භ කරනකොට එදා විෂයය භාර අමාත්‍යවරයා ප්‍රධාන ඇමතිතුමා මැදිහත් වෙලා කියනවා 1 වසර දෙනවා. එදා අයවැයේ දී මම සණ්ඩු සරුවල් කළේ නෑ. මහ ඇමතිතුමාගේ විශ්වාසය තිබ්බා. ඊට පස්සේ මම අහනවා සම්බන්ධීකරණයේ දී නිකම් ඇරැපොල ප්‍රාථමික විද්‍යාලය පටන් ගන්නේ කවද්ද කියලා. විෂයය භාර අමාත්‍යවරයා කියනවා ඒක 2017 පටන් ගන්න ළමයි නෑ කියලා. හැබැයි ප්‍රධාන අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙන්න ඕන, අධ්‍යාපන ලේකම්තුමාට ස්තුතිවන්ත වෙන්න ඕන. හැබැයි 2017 නෙමෙයි පටන් ගත්තේ 2016 මාර්තු

එවලා තියනවා. පෝෂිත කලාපය විතරක් නැඳුරන, ඇරැපොල කියන පෝෂිත කලාපයේ 57 දෙනෙක් ඉන්නවා. 39 යි ගන්නෙ එක පන්තියකට. ඉතිරි ළමයි ටික කොහේද යන්නේ ? හැබැයි කණගාටුයි කියන්න. ඉහළ නිළධාරී මහත්වරු, යම් යම් උදවිය, කලාප අධ්‍යක්ෂ වෙන්න පුළුවන්, අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙන්න පුළුවන්. ඇරැපොල 1-5 අයින් කරනකොට වටපිටාවේ ඉස්කෝලවල විදුහල්පතිවරුන්ගෙන් ඇහුවේ නෑ. 1 වසර පටන් ගන්නකොට, 1 වසරට පන්තියක් වැඩි කරනකොට ඉල්ලුවාම අනේ මම දන්නෙ නෑ, දරුවන්ගේ කරුමෙද කියලා. වටපිටාවල පාසල්වල විදුහල්පතිවරුන්ගෙන් අහන්න ඕන 1 වසර වැඩි කරන්න. එතකොට මම ගුරු සභාවෙන් අහනවා නැඳුරන, ඇරැපොල කියන පෝෂිත කලාපය තුළ 1 වසර එක පන්තියක් තියනකොට 39 යි. එහෙම නම් ඒ 39 ට අමතරව දරුවෝ දාන්න බෑ. එහෙම නම් ඒ ළමයි ඉස්කෝලේ යන්නෙ නෑ. එහෙම නම් ඉස්කෝලේ යන්නෙ නැති වුනාම අපි යෝජනා කරන්න ඕන අළුතෙන් බඳින විවාහයට පත්වෙන අයට වර්ෂයකට හදපන් ළමයි පෝෂිත කලාපය තුළ ළමයි 39 ක්. ළමයි 39 යි පාසලට දාන්න පුළුවන්. ඒ නිසා වර්ෂයකට හදන්න ඕන ළමයි 39 යි. හැබැයි ඒකත් ලබන අවුරුද්දේ 1 ක් අඩු වෙනවා 38 යි. ඒ අවුරුද්දට හදපන් ළමයි 38 ක්. ඊට පස්සේ ඊගාව අවුරුද්දෙත් තව ළමයෙක් අඩු වෙනවා

වෙනකොට ඇරැපොල 1 වසර පටන් ගත්තා. ඕක තමයි විෂයය භාර අමාත්‍යතුමාගේ තත්ත්වය. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේ අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට දේශපාලනය ගාවා ගන්නවාට මම කැමති නෑ. මමත් දේශපාලන පක්ෂයක් නියෝජනය කරන මහජන නියෝජිතයෙක්. මොකද අධ්‍යාපනය සහ සෞඛ්‍ය කියන්නේ අත්‍යාවශ්‍යම කාරණා දෙක. එහෙම නම් දේශපාලනයෙන් තොරව මේවාට සළකන්න ඕන. එල්ලාවල විද්‍යාලය, දේවරක්ඛිත විද්‍යාලය, ඇරැපොල විද්‍යාලය දැන් ඔබතුමා කිව්වා නීත්‍යානුකූලව විදුහල්පතිවරයාගෙන් එවන්න ඕන කියලා. ඇරැපොල විද්‍යාලය

37 යි. ඒ අවුරුද්දට ළමයි 37 ක් හදපන් කියන යෝජනාව ගම්වල ඉන්න මිනිස්සුන්ට ඒ විවාහ මංගල්‍යාවලට පත්වෙන අයට අපි යෝජනා කරන්න ඕන ?

එහෙම නම් මේ අධ්‍යාපනය පිළිබඳව තීන්දු තීරණ ගන්නකොට එහෙම නම් මොකක්ද මේ කරන්නේ ? මේ විදුහල්පතිවරුන්ගෙන් අහන්න නෙමෙයි. එදා 1-5 අයින් කරනකොට කාගෙන්වත් ඇහුවේ නැත්නම් මොකක්ද මේ තියන

ගැටළුව. එහෙම නම් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙන්න පුළුවන්. කලාප අධ්‍යක්ෂවරයා වෙන්න පුළුවන්. ව්‍යූහ කමිටුවක් තියනවා. ඒ ව්‍යූහ කමිටුවට දාලා පන්ති වැඩි කරනකොට ඒ පන්ති වැඩි කරලා ළමයි ඇතුළත් කරගන්න ඔබතුමා කිව්වා වගේ ව්‍යූහ කමිටුවට දානවා නම් ව්‍යූහ කමිටුවේ කී දෙනෙක් ඉන්නවාද ? තුන්දෙනයි ඉන්නේ. කලාප අධ්‍යක්ෂවරයා, අතිරේක අධ්‍යක්ෂවරයා, පළාත් අධ්‍යක්ෂවරයා. මේ තුන්දෙනා තමයි ව්‍යූහ කමිටුවේ ඉන්නේ. දැන් මාස එක හමාරකට වැඩියි දීලා. ලිඛිතව දීලා තියනවා 1 වසර වැඩි කරන්න. දැන් විදුහල්පතිවරුන්ගෙන් අහන්න. ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා ඇතුළු සියළුම මහජන නියෝජිතයින්ට මතක් කරන්න ඕන. අපි උදාහරණයක් හැටියට ගන්නවා කිරිපෝරුව විද්‍යාලය. එතකොට කිරිපෝරුව විද්‍යාලයේ දී යම් පන්තියක දරුවෝ ගැටෙනවා. සාමාන්‍ය දරුවෝ. ගැටෙනකොට මේක විදුහල්පතිවරයා හෝ ගුරුවරයෙක් හරි මේක නිරාකරණය කරනකොට නැවත නැවත මේක ඇවිලි ඇවිලී යනවා. අහළ පහළ ගෙවල් දෙක වෙන්න පුළුවන්. දරුවොනේ. එමනිසා එතකොට දෙමව්පියන්ටත් සිද්ධ වෙනවා මේ ගැන කථා කරන්න. එතකොට දරුවාගේ තියන මානසික මට්ටම, දෙමව්පියන්ගේ තියන මානසික මට්ටම වැටෙනවා. එතකොට ඒ පාසලේ දරුවාට ඉන්න විදිහක් නෑ. ඒ පාසලේ දරුවාට ඉගන ගන්න විදිහක් නෑ. එහෙම නම් බැහැර වෙන්න ඕන. එහෙම නම් ඇඹිළිපොලට වෙන්න පුළුවන්. මීටිපොලට වෙන්න පුළුවන්. කිරිපෝරුවට වෙන්න පුළුවන්. හිඳුරන්ගලට වෙන්න පුළුවන්. නැත්නම් ඇහැළියගොඩට වෙන්න පුළුවන්. මේ දෙමව්පියන්ට ඒ දරුවා දාගන්න ඕන. එතකොට මොකක්ද වෙන්නේ ? අර විදුහල්පතිවරුන්ගෙන් අහනවා මේ දරුවෝ කොහොමද දාන්නේ. එහෙම නෙමෙයි, එහෙම ක්‍රමවේදයක් නෑ. සල්ලි තියන මනුස්සයාට පුළුවන් ලක්ෂ 5 ක් වියදම් කරලා, ලක්ෂ 10 ක් වියදම් කරලා, ලක්ෂ 20 ක් වියදම් කරලා ඕන නම් කොළඹට දාන්න. නැත්නම් සීවලියට දාන්න. නැත්නම් ඇහැළියගොඩ ජාතික පාසලට දාන්න. සල්ලි තියන මිනිහාට පුළුවන්. නැති එකාට මොකක්ද කරන්නේ ? ඒ ළමයා ගෙදර ඉන්නද ? නෑ, ගරු සභාපතිතුමනි, මේක විසදිය යුතු ආකාරයක් කොහොම හරි හදන්න ඕන. මෙතන ඇවිල්ලා නිකම් අපි කෑ ගහනවා. නිකම් තේරුමක් නෑ. ඒ නිසා මේ විෂයය භාර අමාත්‍යවරයා කෙසේ වෙතත් අධ්‍යාපන ලේකම්තුමා ඇහුම්කන් දෙනවා. අධ්‍යාපන ලේකම්තුමා නැත්නම් අධ්‍යාපනය ඉවරයි සබරගමුවේ. මේවා තිත්ත ඇත්ත. අයවැය යෝජනා ගේනකොට අපි බලා ගනිමු ගරු සභාපතිතුමනි. මෙන්න තියනවා කලාප අධ්‍යක්ෂතුමා ඒකට ගහපු ලියුම. මම මේක අයවැයේ දී කියෙව්වා. ගියවර අයවැයේ දී කිව්වා. මෙන්න මේ වගේ අදහස් මොනවාට කියනවා ද කියලා. එක එක්කෙනාගේ උවමනාවට 1 වසර පටන් ගැනීම. පාසල් පද්ධතිය වැඩි වෙනවා. ඒකට මුදල් නොමැතිකම. විදුහල්පතිවරු පත් කරන්න ඕන. ගුරුවරු පත් කරන්න ඕන. එහෙම පාසල් ආරම්භ කරන්න විදිහක් නෑ කියන එක අධ්‍යාපන ලේකම් ඉසුරුපායට කියලා තියෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මැදිහත්වීම තුළින්, මම හිතන්නේ වැඩ බලන මහ ඇමතිතුමන්ලා වෙන්න ඇති අතුල කුමාර රාහුබද්ධ මැතිතුමා නැත්නම් අපේ රංජිත් බණ්ඩාර මැතිතුමා. එහෙම නැත්නම් මේ විෂයයට අදාළ අධ්‍යාපන ලේකම්තුමාත් එක්ක සාකච්ඡා කරලා හරි මේකට කඩිනමින් විසඳුමක් දෙන්න. 2017 පන්ති පටන් ගන්න නම් මේ නොවැම්බර් මාසයේ 08 වෙනිදා. අඩුම ගානේ මේ මාසය අවසාන වෙන්න පෙර මෙය ලබාදෙන්න කියලා, මේ පාසල්වල 1 වසර පන්ති වැඩි කරන්න කියලා කියන කාරණාව ඉල්ලනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, බොහොම කණගාටුවෙන් වුනත් කියන්න ඕන මේක මට ඕන විදිහට, මගේ පෞද්ගලික උවමනාවට නැත්නම් මගේ පෞද්ගලික ක්‍රමවේදයකට කරපු දෙයක් නෙමෙයි ගරු සභාපතිතුමනි. ඇරැපොල ශ්‍රී මහින්ද විද්‍යාලයේ විදුහල්පතිවරයා පිළිබඳව මේ සභාවට තිබුණ සියල්ල ඉදිරිපත් කළා. අත්සන් නාම ලේඛණ ඉදිරිපත් කළා. සියළු චෝදනා ඉදිරිපත් කළා. එදා හිටපු අපේ කංචන ජයරත්න ගරු සභාපතිතුමා ඒක අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කළා. ගරු සභාපතිතුමනි, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ ගරු අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමාට 2015.10.21 අපේ සභා ලේකම් පාලිත නානායක්කාර මැතිතුමා යොමු කරනවා. ඇරැපොල ශ්‍රී මහින්ද විද්‍යාලය සම්බන්ධවයි. ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක මැතිතුමාගේ 10.13 වෙනි දින සබරගමුව පළාත් සභාවේ දී දැක්වූ අදහස් අනුව බැදේ. එබැවින් උක්ත ලිපියේ අඩංගු කරුණු කෙරෙහි ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර අවශ්‍ය කටයුතු කරන ලෙසත්, ඒ පිළිබඳව ඔබතුමා විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග පිළිබඳ ගරු සභාවේ දැන ගැනීම සඳහා වාර්තා කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එතකොට 2015.10.13 තමයි සභාගත කරන්නේ. 2015.10.21 මේක අධ්‍යාපන අමත්‍යවරයාට, විෂයය භාර අමාත්‍යවරයාට යොමු කරනවා. දැන් අවුරුද්දකුත් මාසයකට ආසන්න කාලයක් ගියා. හැබැයි අද වෙනකල් මේ සභාවට වාර්තාවක් නෑ. කොට්ඨාශ අධ්‍යක්ෂතුමිය වාර්තාවක් ගන්නවා. ඒ වාර්තාව දෙනවා කලාප අධ්‍යක්ෂවරයාට. ඒක අධ්‍යාපන ලේකම්තුමාට එනවා. අධ්‍යාපන ලේකම්තුමා ඒ කරුණු සළකා බලලා විදුහල්පතිවරයා ස්ථාන මාරුවක් කරනවා සේවා අවශ්‍යතාවය මත කියලා. ගරු සභාපතිතුමනි, එතකොට වගකිවයුතු නිළධාරියෙක් තමයි අධ්‍යාපන ලේකම්තුමා. අධ්‍යාපන ලේකම්තුම සේවා අවශ්‍යතාවය මත මාරු කරනවා. ඒ මාරු කළාට පස්සේ දවස් 14 ක් තියනවා කරුණු ඉදිරිපත් කරන්න. ඒක ඉදිරිපත් කළාට පස්සේ අධ්‍යාපන ලේකම්තුමා විසින් ප්‍රතික්ෂේප කරනවා. ඊට පස්සේ යනවා ආණ්ඩුකාරතුමා ගාවට. ආණ්ඩුකාරතුමා ගාවට ගිහාම එතුමා ඉල්ලන ඉල්ලීම ඉෂ්ඨ කරනවා. මොකක්ද ? මාරුව කැන්සල් කරනවා. ගරු සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමාට මේ සියල්ල කරන්න පුළුවන් නම් ඔබතුමා ඔය පුටුවේ වාඩිවෙන්න ඕන නෑ. ප්‍රධාන අමාත්‍යතුමා අතන ඉන්න ඕනත් නෑ. අමාත්‍ය මණ්ඩලය එතන ඉන්න ඕනත් නෑ, ඒ දේශපාලන පැත්තෙන්. එහෙම නම් මේකේ ප්‍රධාන ලේකම්තුමා, අධ්‍යාපන ලේකම්තුමා මේ නිළධාරීන් මේ සභාවේ ඉන්නත් ඕන නෑ. එහෙම නම් ඔක්කෝම ටික ආණ්ඩුකාරතුමාට කරන්න පුළුවන්. ආණ්ඩුකාරතුමා මෙලෝ දෙයක් දන්නේ නෑ. ගිහින් කථා කරනවා මමයි ඉෆ්ලාර් මන්ත්‍රීතුමයි. ගිහින් කථා කළාම ලියුමක් ගහනවා ආපහු එවන්න කියලා මේකේ විස්තර. ඒ ෆයිල් එකේ තියන ඒ චෝදනා ටික ඉදිරිපත් කළොත් එහෙම ඒ විදුහල්පතිවරයා ඉන්ටර්ඩික් වෙනවා. හැබැයි සානුකම්පිතව බලලා තමයි සේවා අවශ්‍යතාවය මත මාරු කරන්නේ. මෙන්න ආපහු නොවැම්බර් 15 වෙනිදා තෙක් ඉන්න කියනවා. දෙවියන්ගේ පිහිටයි අධ්‍යාපන විෂයය භාර අයට. එහෙම නම් ආණ්ඩුකාරතුමාට විතරක් මේ සබරගමුව

දීලා මහජන නියෝජිතයෝ හැටියට ඔබතුමන්ලා අපි මේකේ ඉන්නත් ඕන නෑ. ඒ වගේම අධ්‍යාපන ලේකම්තුමා ඇතුළු ඉහළම නිළධාරීන් ඉන්න ඕනත් නෑ. ආණ්ඩුකාරතුමාට බාර දීලා නිකම් ඉන්නයි තියෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමා එක්කෝ බලන්න ඕන ෆයිල් එක ගෙන්වා ගෙන. මට කියනවා ගිහාම එදා මගේ හිතේ විජේනායක

මන්ත්‍රීතුමා හිටියා. ඉෆ්ලාර් මන්ත්‍රීතුමා හිටියා. නැවත වරක් ඉෆ්ලාර් මන්ත්‍රීතුමාව මගේ තනියට එක්කරගෙන ගියා. ගිහාම මොකක්ද කියන්නේ ? ඔබතුමා ගිහිල්ලා ජනාධිපතිතුමාට කියන්න මාව අයින් කරන්න කියලා. මට ඔය ටික කරන්න පුළුවන් නම් මම මෙච්චර කල් තියන්නේ නෑ ගරු සභාපතිතුමා. හැබැයි කොන්ද කෙලින් තියාගෙන මෙම සභාවේ කථා කරන්නේ පක්ෂ භේදයෙන් තොරව මේ සියළුම මහජන නියෝජිතයෝ හොරකම් කරලා නෑ. කාටවත් අනවශ්‍ය කටයුතු කරලා නෑ අපි.

ඒ නිසා ගරු සභාපතිතුමනි ද්වේශසහගතව කරනවා නෙමෙයි චෝදනාවක් එල්ල වුණහම කොච්චර පරිවාස කාලය තිබුණත් නිළධාරියෙක් මාරු කළහම යන්න ඕනේ. අද අධ්‍යාපන ලේකම්තුමාට දාලා මේක ගත්තහම එතුමා බොහොම සාධාරණව කටයුතු කළේ. කොට්ඨාශ අධ්‍යක්ෂකතුමිය සාධාරණව කටයුතු කළේ. ආණ්ඩුකාරතුමා කියනවා මාගාවට මිනිස්සු ආවේ නැනේ මේ ගැන කියන්න කියලා. හරි කෙලියයි එහෙම නම් මහජන නියෝජිතයෝ මේ සබරගමුවේ ඕනේ නෑ. මම මූලික අධ්‍යාපනය ලබපු පාසැල. මගේ පාසැල ගැන කියන්න දෙමව්පියෝ එනවද? මගේ දරුවෝ දෙන්නත් යන්නේ ඒ පාසැලට. ආණ්ඩුකාරතුමාට මේක වැටහෙන්නේ නැත්නම් මොකක්ද මේ ආණ්ඩුකාර තනතුරේ තේරුම. මගේ හිතේ 2004 ඉඳලා

හිටියා ආණ්ඩුකාරවරු හැටියට අන්න හිටියා. මේ පිස්සු නටන්නේ. මට කියන්නේ මොකක්ද ජනාධිපතිතුමාට ගිහින් කියන්න කියලා අයින් කරන්න. බැරි නම් දමලා ගහලා යන්න ඕනේ. ලියුමක් ගහන එකයි තියෙන්නේ ජනාධිපතිතුමාට. ගරු ජනාධිපතිතුමනි මට මේ ආණ්ඩුකාර තනතුර කරන්න බෑ වෙනත් කෙනෙකුට දෙන්න. මම ඉල්ලා අස් වෙනවා කියලා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக *Hon.D.Chairman Udayakantha Gunathilaka*------------------------------------------------------------------------------

ගරු රත්නායක මන්ත්‍රීතුමා ලිපිය සභාගත කරන්න. අපි මේක සභාවේ යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්නම්.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක* கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக *Hon.Member K.L.Ratnayake* ------------------------------------------------

ගරු සභාපතිතුමා මම මේක වේදනාවෙන් කතා කරන්නේ.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக *Hon.D.Chairman Udayakantha Gunathilaka*------------------------------------------------------------------------------

හරි ඒක මට තේරෙනවා. පෞද්ගලිකවත් මම දන්නවා.

*ගරු මන්ත්‍රී පරාක්‍රම අතාවුද* கௌரவ உறுப்பினர் பராக்கரம அதாவுத *Hon.Member Parakrama Athawuda* ----------------------------------------

ඔබතුමන්ලා අතිගරු ජනාධිපතිතුමාට කියන්න ආණ්ඩුකාරතුමා අයින් කරන්න කියලා.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*** **கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக** *Hon.Member K.L.Ratnayake* ------------ -------------------------------------

ඔව්. ඉෆ්ලාර් මන්ත්‍රීතුමා කිව්වද නැද්ද. කිව්වා. ආණ්ඩු පක්ෂයේ ගෙනාවත් විරුද්ධ පක්ෂයෙන් ගෙනාවත් විරුද්ධ නම් විරුද්ධයි අපි.මොකද අපිට ගෙදර ඉන්න එක නැති කරන්න බැනේ.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.*** **கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார** *Hon. Minister Ranjith Bandara* ------------- ------------------------------------------

මන්ත්‍රීවරු 44 දෙනෙක් අපි සභාව කාලයක් මේක නියෝජනය කර ගෙන ආවා. අපි සියළු දෙනාම සාමූහිකව එකඟතාවය අනුව යම් යම් කටයුතු කළා. මම හිතන්නේ සභාවේ නැති ආණ්ඩුකාරතුමා ගැන මෙතන විවේචනය කිරීම එච්චර සුදුසු දෙයක් නෙමෙයි කියලා මම හිතන්නේ. වැරදි ඇති කාගෙත් වැරදි තියෙනවා. නැත්තේ නෑ. නමුත් සභාවේ නැති ආණ්ඩුකාරතුමා ගැන මෙතන කතා කිරීම නුසුදුසුයි කියලා මම මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමනි ඔබතුමාට ප්‍රකාශ කරනවා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** **கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக** *Hon.D.Chairman Udayakantha Gunathilaka*---------------------------------------- ---------------------------------------

සභා රීති නීති යටතේ ඒක කරන්න ඒක කරන්න පුළුවන්කමක් නෑ. නමුත් ප්‍රශ්නය තියෙන්නේ මම ..

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*** **கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக** *Hon.Member K.L.Ratnayake* ------------ -------------------------------------

ගරු සභාපතිතුමනි මම රංජිත් බණ්ඩාර ඇමතිතුමා කියපු දේට එකඟයි. මම බොරුවට විවේචනය කරන්න කැමති නෑ. ඒ නිසා මම කියන්නේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා වෙන්න පුළුවන් ඊට එහා ගිය පරිපාලනයේ ඉහළම නිළධාරියා අධ්‍යාපන ලේකම්තුමා වෙන්න පුළුවන්. එතකොට මම අහන ප්‍රශ්නය මේ කවුරුවත් ඕනේ නෑ. එතුමාට ආණ්ඩුකාරතුමාට මේ ෆයිල් එක ගෙනත් බලන්න මේ අයට චෝදනා තියේද නැද්ද.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** **கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக** *Hon.D.Chairman Udayakantha Gunathilaka*---------------------------------------- ---------------------------------------

ගරු මන්ත්‍රීතුමා දැන් මේ කාරණා මෙතනින් ඉදිරියට ගෙනි යන්න එපා. ඔය ලිපිය සභාගත කරන්න. අපි ඒ කාරණාව අදාල තැන් වලට දැනුම් දෙන්න කටයුතු කරන්නම්. ඉදිරියට තව තවත් වෙනවා

නම් ඒ සම්බන්ධව අපි කාරක සභාවක් පත් කරලා කතා කරමු.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*** **கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக** *Hon.Member*

*K.L.Ratnayake* ------------
-------------------------------------

2015.10.21 මේ සභාවට සභාලේකම්තුමා විසින් කියනවා ඉදිරිපත් කරන්න. අද වෙනකන් ඉදිරිපත් කරලා නෑ. මම ඔබතුමාට කියනවා ගරු සභාපතිතුමනි ඊළඟ අයවැයට හෝ මේ වාර්තාව අපි දැන ගන්න ඕනේ එතුමා වැරැද්දක් කරලා තියෙනවද නැද්ද. මම පෞද්ගලිකව චෝදනා කරලා එතුමාට වැරදි පටවනවද.ඒක අපි දැන ගන්න ඕනේ. ඒ නිසා මම කරන දේ හරි දෙයක්දනැද්ද කියලා මේ ගරු සභාව දැන ගන්න ඕනේ. එතකොට මේ ගරු සභාව දැන ගන්න කොට ජනතාවත් ඒක දැන ගනියි. එහෙම නම් මම කරලා තියෙන්නේ වැරද්දක්ද විදුහල්පතිවරයා කරලා තියෙන්නේ වැරැද්දක්ද එක්කෝ මම වැරැද්දක් කරලා තියෙනවා නම් මේ සබරගමු පළාත් සභාවේ මම ඉල්ලා අස් වෙනවා මේ වාර්තාව ඉදිරිපත් කරලා මම ද්වේශසහගතව මේ යෝජනාව ඉදිරිපත් කරලා තියෙනවා නම් ඒ කරුණු ඉදිරිපත් කරලා තියෙනවා නම් දෙමව්පියන්ගේ ලිපිලේඛණ අත්සන් ලේඛණය නාම ලේඛණය ඉදිරිපත් කරලා තියෙනවා. ඒවා වැරදි නම් මේ සබරගමු පළාත් සභාවෙන් මම ඉල්ලා අස් වෙනවා කියන කාරණාව මම මතක් කරනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි මේ වාර්තාව ගෙනල්ලා මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න . මොකද එතුමා නිර්දෝෂී නම් එතුමා නිර්දෝෂී වෙන්න ඕනේ අනිවාර්යයෙන්ම. එතුමා නිර්දෝෂී නම්

මම පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට ඉන්නවා. නැත්නම් අයින් වෙනවා. ඒකේ දෙකක් නෑ. මේවා ද්වේශසහගතව කරපු ඒවා නෙමෙයි. මේවා සාධාරණ හේතු මත කරපුවා. එතුමාට කරලා තියෙන දේ ලේකම්තුමාට මම ස්තූති කරන්න ඕනේ. එතුමා දක්ෂ නිළධාරියෙක් හැටියට එතුමාව සේවා අවශ්‍යතා මත මාරු කරන්න. නැත්නම් අර තියෙන චෝදනා ප්‍රශ්නයක් වුණා නම් එහෙම ඉන්ටඩ්ට් වෙනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*-------------------------------------------------------------------------------

හරි මන්ත්‍රීතුමා ලිපිය සභාගත කරන්න. ඊළඟ සභාවට වාර්තාව කැඳවන්න කටයුතු කරන්න කියලා නියෝග කරනවා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக Hon.Member K.L.Ratnayake* ------------
-------------------------------------

අවුරුදු ගාණක් සේවයේ හිටපු මනුස්සයෙක්. අපි මේ රක්ෂාව නැති කරන්න හදනවා නෙමෙයි. මම මේක නැවත වරක් සභාගත කරනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*-------------------------------------------------------------------------------

මීළඟ සභාවට ඒ අදාල වාර්තාව කැඳවන්න කටයුතු කරන්න කියලා නියෝග කරනවා. එතුමා කටයුතු කරපු පළවෙනි කාරණාව ඒක. පාසැල් දාහේ ව්‍යාපෘතිය යටතේ 1-5 ඉවත් කිරීම නිසා බොහෝ පාසැල්වල ගැටළුවක් ඇති වෙලා තියෙනවා. දෙමව්පියන්ට දරුවන්ට දේශපාලන අධිකාරියට ලොකු ගැටළුක් තියෙනවා. මේ සම්බන්ධව කමිටුවක් පත් කරලා ඒ අදාල නිළධාරීන් එක්ක සාකච්ඡා කරලා දැනට තියෙන ඉල්ලීම් එක වසර අලුතින් පටන් ගන්න කියලා ඉල්ලීම් රාශියක් තියෙනවා. ඒ අදාල ඉල්ලීම් අනුව අදාල තොරතුරුත් එක්ක සාච්ඡා කරන්න කමිටුවක් පත් කරන්න කියලා මම යෝජනා කරනවා. මේ සභාවේම කමිටුවක් පත් කරලා ඒ කටයුත්ත අපි අපි කෙටි දින කීපයක් ඇතුළත සතියක් ඇතුළත අපි ඉවර කරමු.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக Hon.Member K.L.Ratnayake* -------------------------------------------------

ගරු සභාපතිතුමනි ඒ කමිටුවට අතුල කුමාර රාහුබද්ධ ගරු ඇමතිතුමා,රංජිත් බණ්ඩාර ගරු ඇමතිතුමා, ඒවගේම ගරු අසෝක ජයවර්ධන හිටපු ගරු අමාත්‍යතුමා, අපේ ගරු කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා, ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා මම යෝජනා කරනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பிதவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*--------------------------------------------------------------------------

නම් ටික ආපහු කියන්න. අතුල කුමාර රාහුබද්ධ ගරු ඇමතිතුමා,රංජිත් බණ්ඩාර ගරු අමාත්‍යතුමා, කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා,ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා. හැබැයි මේක කෑගල්ලට තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා විපක්ෂනායකතුමයි ඔබතුමයි. තවත් අවශ්‍ය නම් කට්ටිය.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார Hon. Minister Ranjith Bandara* -------------------------------------------------------

අපිව අතුල ඇමතිතුමයි මාවයි කාරක සභාවෙන් ඉවත් කරන්න කියලා ගෞරවනීය ඉල්ලීමක් කරනවා.ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කාරක සභාව සමන්විත වෙනවා නම් ආණ්ඩු පක්ෂය විපක්ෂය හැටියට කිසිම ගැටළුවක් නැහැ කාරක සභාවක් නම් කර ගන්නා හැටියට ඉල්ලීම් කරනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பிதவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*--------------------------------------------------------------------------

තවත් නමක් යෝජනා කරන්න වෙනවා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்லHon.Opposition Whip Siripala Kiriella* -----------------------------------------------------

වරුණ මන්ත්‍රීතුමා, විපක්ෂනායක තුමා. සලිත කරුණාරත්ත ගරු මන්ත්‍රීතුමා,නිලන්ත ජයසිංහ මන්ත්‍රීතුමා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*--------------------------------------------------------------------------------

කමිටුව රැස් වෙන දිනය අපි සභා කටයුතු කාරක සභාවේදී තීන්දු කරනවා. ඒවගේම අදාල නිළධාරීන් දැනුම් දෙනවා.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச Hon.Opposition Leader W.Somadasa* ------------------------------------------------------------

නිහාල් ෆාරුක් ගරු මන්ත්‍රීතුමාත් මම යෝජනා කරනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*--------------------------------------------------------------------------------

සාර්ථක වෙන්න නම් සියළු දෙනාම පැමිණෙන්න අවශ්‍යයි.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்லHon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------

බාස්කරන් ගරු මන්ත්‍රීතුමා

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*--------------------------------------------------------------------------------

බාස්කරන් ගරු මන්ත්‍රීතුමාත් යෝජනා කරනවා.

*ගරු මන්ත්‍රී අන්නමලෙයි බාස්කරන්கௌரவ உறுப்பினர் அண்ணாமலை பாஸ்கரன் Hon.Member A.Basgaran*-----------------------------------------------------------

බොහොම ස්තූතියි.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக Hon.Member K.L.Ratnayake* -------------------------------------------------

ඉක්මනින් දිනයක් දාගන්න. මොකද නිවාඩු දෙන්නත් ළඟයි දෙසැම්බර්. මේ පංති වලට දරුවන්ගේ නම් ඇතුළත් කර ගන්නත් ඕන කාරණා තියෙනවා. ඉක්මන් කරන්න.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman*

*Udayakantha Gunathilaka*------------------------------------------------------------------------------

සතියක් ඇතුළත නම් යෝජනා කරනවා.

***ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල*** *கௌரவ உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல* *Hon.Member Ranjith Pollgampola*-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි 1-5 පංති වැඩි කිරීමට සමාන්තරව අනිකුත් සමාන්තර පංති වැඩි කිරීමටත් විශාල ප්‍රශ්න තියෙනවා. මම ඉල්ලා සිටිනවා මේකත් ඒ කමිටුවට ඇතුළත් කර දෙන්න කියලා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka*------------------------------------------------------------------------------

ඒ තියෙන කාරණා සියල්ලමත් ඉදිරිපත් කරන්න. මේවා මාසයක් පාසා රැස් වෙනවා නම් ඒ අදාල අමාත්‍යාංශ උපදේශක කාරක සභාව. ඒ කාරක සභාවේදී කතා කළා නම් මෙතෙන්ට මේ ප්‍රශ්න එන්නේ නෑ. එහෙම මං දන්නේ නෑ ඒ කාරක සභාවේ ඒ නිළධාරීන් ඉන්නවා. එතනම තීන්දු තීරණ ගන්න පුළුවන්. එහෙම තියෙද්දී මෙතෙන්ට ආපුවහම තවත් කාලයක් ගත වෙන එක තමයි වෙන්නේ.

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න*** *கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன* *Hon.Member Salitha Karunaratne* -------------------------------------------------

ගරු සභාපතිතුමනි මට මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව ගැන මතක් කරන්න ඉඩ දෙන්න. ඔබතුමා කිව්වා අධ්‍යාපන උපදේශක කාරක සභාවට මන්ත්‍රීවරු එන්නේ නෑ කියලා. අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් වශයෙන් මම ඉන්නවා. හැබැයි උපදේශක කාරක සභාව තියෙනවා කියලා දැනුවත් නෑ. මම ඊට ඉස්සෙල්ලා අධ්‍යාපන ඇමතිතුමාත් එක්ක කෑගහලා තියෙනවා මෙතෙන්දී. එතුමා කිව්වා මීට පස්සේ ඒක වෙන්නේ නෑ කියලා. හැබැයි මම අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් ලෙස පත්වීමක් තියෙනවා. නමුත් කවදාකවත් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට කැඳවීමක් නෑ. දැනුම්දීමක් නෑ.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka*------------------------------------------------------------------------------

ඔබතුමාගේ අවස්ථාව.

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න*** *கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன* *Hon.Member Salitha Karunaratne* -------------------------------------------------

ගරු සභාපතිතුමනි ඔබතුමාගෙන් සභාව කල් තබන අස්ථාවේ යෝජනාවක් ඉල්ලා සිටියේ විශේෂ කාරණාවකට.

පහුගිය දිනක හෙලේ මහා ගාන්ධර්වයා වුණ පණ්ඩිත් ආචාර්ය ඩබ්.ඩී.අමරදේවයන් අභාව්‍යප්‍රාප්ත වුණා. ඒක ජාතියේ මහා අවාසනාවන්ත සිද්ධියක්. ඒ පිළිබඳව සබරගමු පළාත් සභාවේ බලවත් සංවේගය ප්‍රකාශයට පත් කරන්න ඕනේ කියන කාරණාවත් ඒ එක්කම සබරගමුවේ මහා සම්පතක් වුණු ප්‍රබුද්ධ මහා කවියෙක් පහුගිය දවසක අභාවප්‍රාප්ත වුණා ඒක බොහෝ දෙනෙක් දන්නේ නෑ ගරු සභාපතිතුමනි. 70 දශකයේ මේ රටේ මහා ප්‍රබුද්ධ කවියෙක් වෙච්ච ධර්මසිරි රාජපක්ෂ මැතිතුමා මේ කුරුවිට එරත්නේ ඉපදිලා කඳන්ගොඩ ගමේ ජීවත් වෙලා දක්ෂ ගුරුවරයෙක් විදිහට වටිනාකමක් හා ගත්ත කෙනෙක් දිගු කාලයක් අසනීප වෙලා අභාවප්‍රාප්ත වුණා. ධර්මසිරි රාජපක්ෂ කියන්නේ නම කිව්වට බොහෝ දෙනෙක් දන්නේ නෑ. හැබැයි මේ ගරු සභාවේ මන්ත්‍රීවරු දන්නවා. එතුමා විශිෂ්ඨ කවියේ. පරාක්‍රම කොඩිතුවක්කු, මොනිකා රුවන්පතිරණ වගේ පරපුරේ විශිෂ්ඨ කවියෙක්. අපි දන්නවා උසස් පෙළ නව කවිසරණියේ උසස් පෙළට සිංහල උගන්වද්දී මොනිකා රුවන්පතිරණ පරාක්‍රම කොඩිතුවක්කු වැනි කවියන්ගේ කිවිඳියන්ගේ කවි පද්‍ය උසස් පෙළ සිංහල විෂයට ඉගැන්නුවා. හැබැයි ධර්මසිරි රාජපක්ෂ ශූරීන්ගේ කවි උගැන්වූවේ උසස් පෙළ නෙමෙයි විශ්ව විද්‍යාලයට. ඒ තරමට විශ්ව විද්‍යාලය පරිශීලනය කරන්න තරම් දක්ෂ හොඳ වටිනා ප්‍රබුද්ධ කවි ලිව්ව ධර්මසිරි රාජපක්ෂ මැතිතුමා පහුගිය දවසක අපෙන් අභාවප්‍රාප්ත වුණා. එතුමා පිළිබඳව අපේ සංවේගය ප්‍රකාශ කරන ගමන් ගරු සභාපතිතුමනි ඒ නිවසේ රේඛීය අමාත්‍යාංශයේ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ මල් වඩමක් ප්‍රදර්ශනය කරලා තිබුණා. අවාසනාවකට සබරගමු පළාත් සභාවේ සංස්කෘතික අමාත්‍යාංශයෙන් සංවේගය එළ කරන්න කොහේවත් සඳහනක් තිබුණේ නෑ ගරු සභාපතිතුමනි. මේක දැන ගත්තට පස්සේ මම කියන්නේ නෑ අදාල අයට උත්සාහ කළා සම්බන්ධ කරලා කියන්න අඩුම වශයෙන් ආදාහනය දවසේ සබරගමු පළාත් සභාවේ සංස්කෘතික අමාත්‍යාංශයෙන් උදව්වක් කරන්න එහෙම නැත්නම් ඔහු වෙනුවෙන් යම් ප්‍රකාශයක් හෝ කරන්න ඒ නිවාඩු දවස් දෙකේ සම්බන්ධ කර ගන්න බැරි වුණා. ඒ හින්දා ගරු සභාපතිතුමනි මම මතක් කරන්නේ 1975 ඉතිරි සහෘදයන් කියලා විශිෂ්ඨ කාව්‍ය ග්‍රන්ථයක් එතුමා ලියලා තියෙනවා. 2013 සඳ වතුර කියලා ඉතා විශිෂ්ඨ කාව්‍ය ග්‍රන්ථයක් ලියලා තියෙනවා. ඒවගේම 1985 ශක්තියේ පුෂ්පය ඉතා විශිෂ්ඨ නිර්මාණයක් කරලා තියෙනවා. ඊට අමතරව ධර්මසිරි රාජපක්ෂ ශූරීන් විසින් එළ නොකළ විශිෂ්ඨ පද්‍ය රචනා තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මම යෝජනා කරනවා මේ සභාවට පළාත් සභාවේ සංස්කෘතික අරමුදලින් මේ විශිෂ්ඨ ප්‍රබුද්ධ මහා කවියා අපේ සබරගමුවට මහා ආඩම්බරයක් වෙච්ච රත්නපුරට මහා මිණි කිරුළක් වෙච්ච ධර්මසිරි රාජපක්ෂ ඒ කිවිඳාගේ ඒ නොකළ ප්‍රකාශයට පත් නොකළ කවි ග්‍රන්ධයක් විදිහට අපේ පළාත් සභාවෙන් සංස්කෘතික අමාත්‍යාංශයෙන් ප්‍රකාශයට පත් කරලා අනුග්‍රහය දක්වවලා එතුමාට ගෞරව දක්වන්න කියලා ඉල්ලා සිටිනවා බොහොම ස්තූතියි.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකගௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*------------------------------------------------------------------------------

බොහොම ස්තූතියි ගරු මන්ත්‍රීතුමනි. මීළඟට අපේ විපක්ෂනායක ඩබ්.සෝමදාස මැතිතුමාට අවස්ථාව ලබා දෙනවා. මේකේ ලියලා තියෙනවා. ආරියංශ බාලසූරිය ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී බී.ආරියවංශ*** *கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ* *Hon.Member B.Ariyawansha*
---------------------------------------------

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී විශේෂ යෝජනාවක් ඉදිරිපත් කරනවා. ඇඹිලිපිටිය කලාපයේ පනාමුර මහා විද්‍යාලයේ පසුගිය කාලයේ පාසැල් දහස ව්‍යාපෘතිය තුළින් 1-5 ඉවත් කළා. ඉන් පසුව ඒ ප්‍රදේශයේ වෙනත් ස්ථානයක කුඩා බිම් කොටසක නැවත 1-5 වසර පනාමුර ප්‍රාථමිකය වශයෙන් නැවත ආරම්භ කලා. මේ වෙන කොට ගිය වර්ෂයේදී ළමයි ඇතුළත් කර ගෙන පංති දෙකක් මේ වෙන කොට පැවැත්වෙන්නේ පනාමුර විහාරස්ථානයේ. විහාරස්ථානයේ දහම් පාසැල පැවැත්වෙන ගොඩනැගිල්ලක. ඒ නිසා ඒ අවස්ථාවේ ඉදන් ඉල්ලීම් කලා ඒ ගොඩනැගිල්ලක් ලබා දෙන්න කියලා අධ්‍යාපන ඇමතිතුමා මෙතන නැති වුණත් ඔබතුමා දැනුවත් කරන්න ඒ අවස්ථාවේදී ඉල්ලීම් කරලා මේ වෙන කොට ලබන වර්ෂයේ ජනවාරි වෙන කොට නැවත ඒ ප්‍රදේශයේ දරුවන්ට පාසැලට ඇතුළත් වෙන්න ඉඩකඩ නෑ. දැනට පාසැලේ ඉඩ පහසුකමුත් නෑ. ඒ නිසා ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ. ඒ නිසා මේ වර්ෂයේ අධ්‍යාපන ඇමතිතුමා පොරොන්දු වෙලා තිබුණා පාසැල් ගොඩනැගිල්ලක් ලබා දෙනවා කියලා ඉඩ පහසුකම් නැති නිසා ඒ පාසැලේ තෙමහල් පාසැල් ගොඩනැගිල්ලක් තමයි ඒ ප්‍රදේශයේ ජනතාව ඉල්ලුම් කරන්නේ.එම නිසා ගරු සභාපතිතුමනි අධ්‍යාපන ඇමතිතුමා නැති වුණත් ඔබතුමා විශේෂයෙන් දැනුවත් කරලා හැකි ඉක්මනින් මොකද පාසැල් අධ්‍යාපනයට විශාල මුදල් සම්භාරයක් වෙන් වෙලා තියෙනවා. ඒ මුදලින් හැකි ඉක්මනින් මේ පනාමුර ප්‍රාථමික විද්‍යාලයට අවශ්‍ය කරන ඒ ගොඩනැගිලි පහසුකම් ලබා දෙන්න කියලා මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------------------------

ඒ යෝජනාව ලේකම්තුමාටත් ගරු ඇමතිතුමාටත් යවන්න කටයුතු කරන්න කියලා යෝජන කරනවා. මීළඟට ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** *கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.Member M.Y.M.Iflar*
---------------------------------------------

ගරු සභාපතිතුමනි අද මේ මොහොතේ නොහිටියත් අධ්‍යාපන ඇමතිතුමා ගරු සභාපතිතුමනි අද මේ වෙන කොට අපිට දැන ගන්න ලැබිලා තියෙන දෙයක් තමයි සියළු පාසැල් වලට සනීපාරක්ෂක පහසුකම් සහ විවිධ අවශ්‍යතාවයන් සඳහා ප්‍රතිපාදන වෙන් කරලා දීලා තිබෙනවා. නමුත් මට දැන ගන්න ලැබිලා තියෙනවා ගරු සභාපතිතුමනි මේ වෙන කොට ඵලදායිතාවයක් නොවෙන ඒවගේම වැසී යන පාසැල් සඳහාත් සනීපාරක්ෂක පහසුකම් සලසා තිබියදීත් නැවතත් මේවා ලබාදීමට කටයුතු කරනවා කියලා. මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා ගරු සභාපතිතුමනි මේ සම්බන්ධයෙන් කඩිනමින් මොකද මම දන්නවා සමහර අය කර්මාන්ත කිරීම සඳහා සමහර විදුහල්පතිවරු මේ වෙන කොට විශාල ප්‍රමාණයක් මේ වෙන කොට ග්‍රාමීය

පාසැල්වල මෙවැනි දේවල් සඳහා ගෙවීමක් කරලා තියෙනවා. නමුත් මේ වෙන කොට ලැබිලා තියෙන තොරතුරු අනුව අදාල පාසැල මේ ක්‍රියාව එළදායිතාවෙන් තොර කියන එක දැන ගන්න ලැබිලා තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අධ්‍යාපන අමාත්‍යතුමාටත් ඒවගේම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු මොකද මට දැන ගන්න ලැබිච්ච විදිහට වැසිකිලි පද්ධති පහක් තියෙනවා ළමයි පහක් නෑ. තවත් වැසිකිලි පද්ධති හතක් හදනවා. මේ තත්ත්වය ගත්තහම විශාල මුදල් ප්‍රමාණයක් අපතේ යාමක් අපි දකිනවා. සමහර පාසැල් අපි දකිනවා රත්නපුර කලාපයේ රත්නපුර නගරයේ ළමයි ඉන්නේ 32 යි. ගුරුවරු 16 ක් ඉන්නවා. මෙන්න මේ තත්ත්වය පිළිබඳ ඔබතුමාගේ අවධානය මම බැලුවේ අධ්‍යාපන ඇමතිතුමා හිටියා නම් මේ සම්බන්ධව දැනුවත් කරන්න මොකද මේක විශාල බරපතල ගැටළුවක් අපිට. ඒ නිසා අපි යම් මුදලක් වියදම් කිරීමේදී පහසුකම් ලබාදිය යුතුයි. පැහැදිලිවම ලබාදිය යුතු පාසැල් නෙමෙයි සමහර ඒවා එළදායිතාවයෙන් තොර ඒවගේම වැසී යන පාසැල් සම්බන්ධයෙන් මෙවැනි දේවල් කිරීමේදී අවධානය යොමු කරලා නැවතත් සමීක්ෂණය කරලා නිවැරදි දේ නිවැරදි ආකාරයෙන් කටයුතු කරන්න කියලා මම ඔබතුමාට උපදෙස් දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*------------------------------------------------------------------------------

ඒ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරන්න කටයුතු කලා කියලා කිව්වා.ඒකටම ඒ තියෙන යෝජනා සියල්ලම ඉදිරිපත් කරන්න කටයුතු කරන්න.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ கௌரவ அமைச்சர் அதுல குமார ராஹுமபத்த Hon. Minister Athula Kumara Rahubadda* -----------------------------------------------------

ගරු සභාපතිතුමනි ඉතාමත් හොඳ ප්‍රශ්නයක්. මොකද මේ ආණ්ඩුවක් මාරු වෙන කොට තව ආණ්ඩුවක් එනවා. වැසිකිලි පද්ධති හදනවා. විද්‍යාලයේ ගණනාවක් වැසිකිලි තියෙනවා. මේකේ අඩුම තරමේ අක්‍රිය වෙලා තියෙන්නෙ නඩත්තුවක් නෑ. කරාමය නෑ. දොර කැඩිලා. සරනේරුව නෑ, ගොඩනැගිල්ල හොඳයි. මේවගේ පුංචි පුංචි දේවල් තමයි මේවගේ විශාල මුදලක් අවශ්‍ය වෙන්නේ නෑ මේවා නඩත්තු කරන්න. එක්කෝ ටයිල් ටිකක් දාගන්න. එක්කෝ මේ අලුත්වැඩියා කරලා තියෙන ටික පරිස්සම් කළොත් මෙතුමා කියනවා වගේ විද්‍යාලයේ භූමියේ නෑ භූමිය ආක්‍රමණය කරලා ඉවරයි ගොඩනැගිලි වලට. ඒ නිසා මේක මම දන්න හැටියට අධියර දෙකකට මේ මට්ටමින් පළාත් මට්ටමින් ක්‍රියාත්මක වෙනවා. මධ්‍යම ආණ්ඩුවෙනුත් විශාල මුදලක් එනවා. ලබන වර්ෂයට වැසිකිලි පද්ධති සඳහා . පාසැල් වත්තේ තියෙන්නේම වැසිකිලි පද්ධතියක් විතරයි එතකොට. අර කැඟහනවා දරුවන්ට පංති කාමරයක් වැඩි කරන්න. ඒ නිසා මේකේ නඩත්තුවට අවශ්‍ය මුදල් ටික දාලා මේ පද්ධති ටික නඩත්තු කරනවා නම් මීට වඩා හොඳයි.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකகௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*------------------------------------------------------------------------------

නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා. கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார Hon. Minister Ranjith Bandara* -------------
------------------------------------------

මේක අපි සියළු දෙනාටම බලපාන ප්‍රශ්නයක්. මේ පහුගිය කාලයේ අපිට මාස පහකට හයකට කලින් දුන්නා අධ්‍යාපනයේ නව සංවර්ධන සැලැස්මක් කියලා සැලැස්මක් දුන්නා. ඒ සැලැස්ම පරිශීලනය කරන කොට අපිට තේරුම් ගියා අපි නියෝජනය කරන ප්‍රදේශවල සමහරක් ව්‍යාපෘති සිද්ධ වෙලා. විවිධ රජයන් තුළින්. හැබැයි මේ සියල්ලක්ම ඒකරාශී කරලා නැවත වතාවක් ඒ වැසිකිළි පද්ධතිය වෙන්න පුළුවන්. ඒ ගොඩනැගිල්ල වෙන්න පුළුවන්. පැති බැම්ම වෙන්න පුළුවන්. ජල පහසුකම් වෙන්න පුළුවන්. නැවත වතාවක් මේ ලැබිච්ච මුදල් වලින් ආයේ කරන්න. මේක මේ සැලැස්ම හදලා තියෙන්නේ කවුද කියන එක අපි දන්නේ නෑ. හැබැයි අපි මේක මහජන නියෝජිතයින්ගේ අපි මේක සම්බන්ධව අදහස් ගත්තේ නෑ. මේ සැලැස්ම හදන කොට මම විශ්වාස කරනවා පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාගේ ඉඳලා පල්ලෙහාට එන්න කලාප හා කොට්ඨාශ ඒ සියළු දෙනාගේම අදහස් අරගෙන. හැබැයි මේ අදහස්වල තිබිච්ච සත්‍ය බොහෝ දුරට වසන් කරලා අර ඉෆ්ලාර් මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය තමයි පාසැලේ ළමයි පස් දෙනයි ඉන්නේ. වැසිකිළි පහක් නැවත වතාවක් හදනවා. මේවගේ කටයුතු මේ පළාත තුළම සිද්ධ වෙනවා. ඒ නිසා මේක ගැන අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා අද නැති වුණත් නිළධාරීන් කවුරු හරි ඉන්නවා නම් මේ ගැන අවධානය යොමු කර ගන්න ඕනේ. ඒ ගැන නැවත වරක් සොයලා බලලා කටයුතු කරන්න කියන ඉල්ලීම තමයි අපි කරන්නේ. මොකද මුදල් අපරාදයක්. වැසිකිලි පද්ධති තියෙන පාසැල් වලට නැවත වරක් මුදල් වෙන් වෙලා තියෙනවා වැසිකිලි පද්ධතියට. ජල පහසුකම් තියෙන පාසැල් වලට නැවත වතාවක් ජල පහසුකම් දෙනවා.ගොඩනැගිල්ලක් තියෙන තැනට නැවත වතාවක් ගොඩනැගිල්ලක් දෙනවා. අපි දැක්කා තෙප්පනාව කුමාර විද්‍යාලයේ අපි ඉල්ලුවා පාසැල් ගොඩනැගිල්ලක්. ඒ ගොඩනැගිල්ල වෙනුවට වෙන තැනක ගොඩගනැගිල්ලක් ඉදි කරන්න මුදල් ලැබිලා තියෙනවා. ඒවගේ එක තැනකට දෙයාකාරයෙන් මුදල් ලැබිලා තියෙනවා. ඒ නිසා අනවශ්‍ය මුදල් වියදම් කිරීමක් මේ තුළ සිද්ධ වෙනවා. ඒ ගැන සොයා බලන්න අත්‍යාවශ්‍ය කටයුතු ඔබතුමා නියෝගයක් ලබා දෙන්න අධ්‍යාපන ලේකම්තුමාට මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න. මහජන නියෝජිතවරුන්ගෙන් මේ ගැන අදහස් ලබා ගන්න. අපිත් හැම තැනම මේ මහජන නියෝජිතවරු හැම තැනම ඇවිදිනවා. හැම පාසැලකටම යනවා මොකක් හෝ උත්සවයකට. ඒ ඉල්ලීම් කරන ඉල්ලීම් වලට අපි දෙන යෝජනා ක්‍රියාත්මක වෙන්නේ නෑ. හැබැයිඅධ්‍යාපන නිළධාරීන් සොයා ගන්නා දෙන ඉල්ලීම් වලට ක්‍රියාත්මක වෙනවා. මම දන්නේ නෑ මේ තොරතුරු කොහේන්ද ගත්තේ කියලා. මම දන්නවා වෙනදට පළාතේ තොරතුරු ගන්න කොට අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා සහ ලේකම්වරයා එක්ක සාකච්ඡා කරනවා. අපිටත් මහජන නියෝජිතවරුන් හැටියට අදහස් වුවමාරු කරන්න අවස්ථාවක් ලැබෙනවා. දැන් වැඩ මුළුවක් තිබෙනවා. අයවැය තිබෙනවා. ඒ සම්බන්ධව කතා කරන්න අපිට අවස්ථාවක් ලැබෙනවා අපේ යෝජනා ඉදිරිපත් කරන්න. නමුත් පහුගිය කාලයේ ඒ දුන්න පොතේ සඳහන් කිසිවක් අපි යෝජනා කරපු දේවල් සමහරක් ඒවානැහැ . මම යෝජනා කරනවා පහුගිය කාලයේ ඉඳන්ම ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. අපේ සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා ඉන්නවා අනිකුත් මන්ත්‍රීතුමන්ලා ඉන්නවා රත්නපුර නගරයට ප්‍රාථමිකයක් අත්‍යාවශ්‍ය කාරණාවක් මේක. ඇහැලියගොඩ ප්‍රාථමිකය තියෙනවා. කුරුවිට ප්‍රාථමිකය තියෙනවා. පැල්මඩුල්ල ප්‍රාථමිකය තියෙනවා. ඇඹිලිපිටිය තියෙනවා. බලංගොඩ තියෙනවා. හැම තැනම

තියෙනවා. රත්නපුර නගරයට ප්‍රාථමිකයක් නෑ. මේක හැමදාම මම මතු කරනවා. නමුත් රත්නපුරට ප්‍රාථමිකයක් නෑ. අර මන්ත්‍රීතුමා කියන කතන්දරය. මේ සියළු දෙනාම කියන කතන්දරය සත්‍යයක්. ළමයි 40,39,38,37 වෙන කොට මේ පාසැල් පෙනි පෙනී යන්න බෑ. රත්නපුර නගරයට පාසැලකට එන කොට ලකුණු 15 ක් කැපෙනවා පාසැල් තුනකට ඉල්ලුම් කරපුවා. ලකුණු කැපෙනවා. ප්‍රාථමිකයක් නෑ. මෙන්න මේවාට අවධානය යොමු කරලා නෑ මේ අධ්‍යාපන නිළධාරීන්. මම දන්නේ නෑ මොකක්ද හේතුව කියලා. අපි යෝජනා කරන නිසාද කියලා දන්නේ නෑ. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකගෞරව பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*---------------------------------------------------------------------------

ගරු අමාත්‍යතුමාගේ අදහස් ඉතාම නිවැරදියි. නිවැරදිව ඉදිරිපත් කිරීම සම්බන්ධව ස්තූතිවන්ත වෙනවා. ඒවගේම පහුගිය කාලයේ ගත්තා තොරතුරු ඉල්ලුම් පත්‍රයක් දීලා නිවැරදි තොරතුරු ටික ගත්තා. අපි මිටි පිටින් ගෙනල්ලා දුන්නා. නමුත් ඒවා සම්බන්ධව බොහෝ තැන්වල ක්‍රියාත්මක වෙලා නැති ගතියක් තමයි තියෙන්නේ. මෙහේ තියෙන තොරතුරු වලින් අරන් තියෙනවා . නමුත් මේහේ තොරතුරුවල ළමයි ලේඛණවල මෙච්චරක් තියෙනවා කියලා කිව්වට ළමයි නෑ. එහෙම ප්‍රශ්න තියෙනවා. ඒ නිසා ඒ සම්බන්ධවත් අපි ලේකම්තුමා අදාල නිළධාරීන් එක්ක අපි අද දිනය තීරණය කරන කමිටුවට අපි කතා කරලා තීන්දු කරන්න අවශ්‍ය කටයුතු කරමු.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச Hon.Opposition Leader W.Somadasa* -----------------------------------------------------------

ගරු උපසභාපතිතුමනි මිනිත්තුවක් දෙන්න අවසර. ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා පෙන්නලා දුන්නු නාස්තිය ගැන කතා කරන කොට මේ පාසැල ළඟම පාසැල හොඳම පාසැල කියලා කියන කොට අධ්‍යාපන ඇමතිතුමාගෙන් ප්‍රශ්න රාශියක් මම ඇහුවා. ඒ ප්‍රශ්න වලට පිළිතුරු කිසිවක් තවම ලැබිලා නෑ. අපි ඒ පාසැල හොඳම පාසැල කියලා සංවර්ධනය සඳහා අපි නම් කරලා එච්චහම අපි ගිහිල්ලා පරීක්ෂා කරලා බැලුවා. විශාල නාස්තියක් තියෙනවා. සුදුසු දේවල්නෙමෙයි කෙරෙන්නේ. නුසුදුසු දේවල් අවශ්‍ය නැති දේවල් කෙරෙනවා. ඒ නිසා මම සභා දෙකට පෙර ඉල්ලීමක් කළා. මම අද සභාවේ ප්‍රධාන ඇමතිතුමා නොහිටපු නිසා මම ප්‍රශ්න ඇහුවේ නෑ. මේ අදාල ප්‍රශ්නයට මාතෘකාවක් වුණ නිසා තමයි මම පෙන්නලා දෙන්නේ. මේවාට අපිට ඉතා ඉක්මනින් පිළිතුරු ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකගෞරව பி.தவிசாளர் உதயகாந்த குணதிலகHon.D.Chairman Udayakantha Gunathilaka*---------------------------------------------------------------------------

නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය கௌரவ நமிந்த அனுரபிரிய
Hon.Member Naminda Anurapriya-------*
----------------------------------------------------

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි සභාව කල් තබන අවස්ථාවේදී මා අවස්ථාව ඉල්ලා සිටියේ විශේෂයෙන්ම එළඹෙණ සති කීපය තුළ මේ රටේ ජාතික අයවැය ප්‍රකාශයට පත් කරනවා. ඒ ප්‍රකාශයට පත් කිරීමත් සමග දැනට අයවැය පිළිබඳව දැන ගන්න තියෙන කරුණුත් එක්කලා පහුගිය කාලයේ වැඩි වුණු වැට් බද්ද හරහා සාමාන්‍ය ජනතාවට මේ රටේ ජීවත් වුණු පොදු මහජනතාවට සුවිශාල බදු බරකට කරගහන්නට සාමාන්‍ය ජනතාවගේ පිටින් මේ බදු බර ගෙන යන්නට මේ රජය කටයුතු කරන බව අපිට දැන ගන්නට ලැබෙනවා. දැනටමත් අපි ඒ පිළිබඳව වැට් බද්දේ මූලික කටයුතු ක්‍රියාත්මකවීමත් සමග අපිට දැන ගන්නට ලැබුණා. ඒ නිසා අපි යෝජනා කර සිටින්නේ ඇත්තටම පහුගිය ආණ්ඩුවේ හොරු ඉන්නවා රත්තරං අශ්වයෝ ඉන්නවා. මහා පරිමාණ වංචාවල් කළා. මහා ලොකුවට ණය ගත්තා කියලා කිව්වා. එහෙම කියලා බලන කොට ඇත්තටම අවුරුදු කීපයක් ගත වුණාට පස්සේ දැන් පේනවා කවුද හොරකන් කරලා තිබෙන්නේ මොකක්ද රටට වෙලා තියෙන්නේ රට පත්වී තිබෙන තත්ත්වය පිළිබඳව අපි දැනගෙන තිබෙනවා. ඒ පිළිබඳව බැලුවහම සබරගමුවේ ජනතාව අපි ගම්වලට ගියහම අපේ රටේ ජනතාව ගමේ ජනතාව අපිට කියා තිබෙන්නේ ඇයි සබරගමුවේ මන්ත්‍රීවරු හැටියට ඔබතුමන්ලා පෙනී ඉන්නේ නැත්තේ. අපිට පෙනී සිහිටින්න තියෙන්නේ මේ පළාත් සභා භූමිය. මෙතන තමයි අපි ඉන්න තැන. ඒ නිසා අපි කියන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ඇග උඩින් යන මේ මහා බදු කන්දරාව මේක වෙනස කළ යුතු නොවෙයි. මේකට තිබෙන එකම විසඳුම තමයි අපි දන්නවා පහුගිය දවස්වල පහුගිය වසරක දෙකක කාලය තුළ මේ රටේ මහ බැංකුවේ අධිපතිවරයාව හිටපු මේ රටේ අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා මහ බැංකුවේ අධිපතිවරයා ලෙස පත් කර ගත්තාට පස්සේ මේ රටේ නෙමෙයි මේ ලෝකයේම කරපු ලොකුම හොරකම මේ මහ බැංකුවේ අධිපතිවරයා පැමිණීමත් සමග මේ රට තුළඇති වුණා මහා ඛේදජනක ඉරණමක්. එහි ප්‍රතිවිපාක සාමාන්‍ය ජනතාවගේ පිටින් යන්නට අවස්ථාව එන්නේ ඉදිරි මාස කීපය තුළ ඉදිරි වසර කීපය තුළ මේ රටේ ජනතාවට කෙළින් හිට ගැනීමේ අයිතියවත් නැති මට්ටමේ විශාල බැදුම්කර වංචාවක් තමයි මේ අර්චුන් මහේන්ද්‍රන් මැතිතුමා පහුගිය කාලයේ කරලා තිබෙන්නේ. ඒ පිළිබද සත්‍ය ඔප්පු වෙලා තිබෙනවා. ඒක සොරකමක් බවට ඒක වංචාවක් බවට පිළිඅරගෙන තිබෙනවා. ඒක කෝප් වාර්තාවේ සටහන් වෙලා තිබෙනවා. ඒ නිසා සබරගමුවේ ජනතාව ඉල්ලා සිටින්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මේ අර්ජුන් මහේන්ද්‍රන් මැතිතුමාව මේ අනිකුත් පහුගිය කාලයේ සහ මේ රටේ ගෙන එන නීතිය අනුව වංචාවක් කලා නම් දූෂණයක් කළා නම්, හොරකමක් කලා නම් ඔහුට අදාල නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. ඒ නිසා සබරගමු පළාත් සභාව හැටියට අපි යෝජනා කර සිටිනවා අර්ජුන් මහේන්ද්‍රන් මැතිතුමා වහාම අත්අඩංගුවට අරගෙන අපේ මහ බැංකුව තුළින් වංචා කරපු මුදල් නැවත මේ රටේ ජනතාවගේ සුබ විහරණය පිණිස මේ රටේ ජනතාවගේ බදු බර අඩු කරන්නට මේ රටේ ජනතාවගේ මේ සහන කප්පාදුව නතර කරලා සුභ සමාජවාදී රටක් ගොඩ නගා ගෙන ආපු ඉදිරි පියවර ඉස්සරහට ගෙන යාමට අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමාව මහ බැංකුවේ අධිපතියාව වහාම අත්අඩංගුවට ගන්න කියන යෝජනාව මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මම යෝජනා කර සිටිනවා. ඊට සමගාමීව අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමාව ගෙනාපු ඔහුට උපදෙස් දීපු ඔහුව මෙහෙයවපු සියළු දෙනාම අධිකරණයට ගෙනල්ලා නීතිපතිට

මේක ඉදිරිපත් කරන්නට ඉස්සෙල්ලා මේක අධිකරණමය ක්‍රියාමාර්ගයකට යන්නට ඕනේ කියලා අපි පළාත් සභාවක් හැටියට යෝජනා කර සිටිනවා ගරු සභාපතිතුමනි.

ඒවගේම අපි දන්නවා අද සබරගමු පළාත් සභාවේ උපාධිධාරියෝ දහස් ගාණක් මේකේ ලියාපදිංචි වෙලා තියෙනවා ගරු සභාපතිතුමනි. උපාධිධාරීන්ට රැකියාවල් නෑ. ඒ නිසා අපි කියන්නට අවශ්‍යයි මේ උපාධිධාරීන් පිරිස මේ එළඹෙණ 2017 වර්ෂයේදීවත් අඩුම තරමේ සබරගමු පළාත් සභාවේ ලියාපදිංචි වෙලා තියෙන උපාධිධාරීන් දෙකෙන් පංගුවකටවත් අඩුම තරමේ රක්ෂාවල් දෙන්න කියලා. අපි දැක්කා පහුගිය කාලයේ රක්ෂාවල් දෙන හැටි. අපි දැක්කා උපාධිධාරීන් අපි දැක්කා උස කට්ටියත් ඉන්නවා. ඒ අයට නම් අර නිවාස අමාත්‍යාංශයේ නම් රැකියාවල් හරි යන්නේ නෑ. උස අය ඉන්නවා මිටි අය ඉන්නවා. මධ්‍යස්ථ අය ඉන්නවා. ඉතිං උපාධිධාරීන් සමහර අය අපිට කියනවා උපාධිධාරී සංගමයේ අනේ මන්ත්‍රීතුමා කම්කරු රක්ෂාවක් හරි අපිට දෙන්න කියලා. ඒ නිසා අපි යෝජනා කර සිටිනවා අලුත් අයවැය ඉදිරිපත් කළාට පස්සේ අලුත් මේ යහපාලන ආණ්ඩුවට අපි යෝජනා කර සිටිනවා හැකි ඉක්මනින් මේවාට පිළිතුරු දෙන්න. මේ උපාධිධාරීන්ට රැකියාවල් දෙන්න. සාමාන්‍ය පෙළ පමණක් කරපු අයට රැකියාවල් දෙන්න. දෙනවා කියපු රැකියාවල් දස ලක්ෂය කෝ කියලා අද ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු යන කොට ගම්වල ජනතාව අපෙන් අහනවා. ඉතිං අපි අහනවා අර දස ලක්ෂයක් රැකියා දෙන්නම් කියලා කියපු උදවියගෙන් ඉල්ලන්න කියන කාරණාව අපිට කියන්න බෑ. මොකද මේ රටේ ජනතාවට ජීවත්වීමේ අයිතිය ජීවත්වීමේ වටපිටාව රජයක් හැටියට ලබාදිය යුතුයි. එහෙම නැතුව තියෙන අය තියෙන අයට සලකන්නයි නැති අයට පුළුවන් විදිහට ජීවත් වෙන්නයි කියන්නයි රජයක් අවශ්‍ය නෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා මේ රටේ දැවෙන ප්‍රශ්නයක් හැටියට තියෙන ජීවන බර අඩු කරන්නට ඒවගේම ගොවියාට කම්කරුවාට සහන දෙන්නට ඒවගේම පහුගිය කාලයේ කප්පාදු කරපු විශ්‍රාම ඒවගේම නව සේවකයින්ට ලබාදීමට තිබුණු විශ්‍රාම ඒවා සියල්ලක්ම අලුත් ආකාරයට කප්පාදු කරලා මේ රටේ ජනතාවගේ සුභ සාධනය කප්පාදු කිරීමට එරෙහිව මේ සබරගමුව පළාත් සභාව තුළ අපි පෙනී සිටිනවා ,අපි හඬ නගනවා. ඒ වෙනුවෙන් අරගල කරනවා කියමින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අර්ජුන් මහේන්ද්‍රන් මැතිතුමාව වහාම අත්අඩංගුවට ගන්න කියන යෝජනාව අපි මේ පළාත් සභාවේ යෝජනා කර සිටිනවා.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක* கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka-----------------------------------------------------------------------------

බොහොම ස්තුතියි ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා. මේක විවාදයකට ගියොත් දුරදිග යනවා. මේක විවාදයකට යෑම අවශ්‍ය නෑ.(ඝෝෂාව) කරන්න බෑ . මම එදත් ඉල්ලීම කළා. ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය* கௌரவ நமிந்த அனுரபிரிய Hon.Member Naminda Anurapriya-------------------------------------------------------

අපි කියන්නේ හොරුන්ට යන්න කියලා. හොරුන්ට ඉල්ලා අස් වෙන්න ඕනේ. එයා ඉල්ලා අස් විය යුතුයි. එයා

අත්අඩංගුවට ගන්න ඕනේ. අපි කතා කරන්නේ යහපාලනයට.

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකගௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*Hon.D.Chairman Udayakantha Gunathilaka-----------------------------------------------------------------------------

මම කියන්නම් වාඩි වෙන්න. (සෝෂාව) විපක්ෂනායකතුමා වාඩි වෙන්නකෝ.

*ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
Hon.Gov.WhipAsoka Jayawardane
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි නමින්ද ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කතාවේදී සඳහන් කළේ මේ සභාව තීන්දු කරනවා කියලා. සබරගමු පළාත් සභාව කියලා එතුමාගේ කතාවේදී ප්‍රකාශ කළා සබරගමු පළාත් සභාව කියලා එතුමාට අයිතිය තියෙන්න ඕනේ. එතුමාට ඒ අයිතිය තියෙන නිසයි ප්‍රකාශ කරන්න යෙදුණේ. මොකද අපි ආණ්ඩු පක්ෂයේ විතරක් නෙමෙයිනේ.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර් கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*Hon.Member M.Y.M.Iflar
----------------------------------------

එතුමාගේ පෞද්ගලික මතය. සබරගමුව පළාත් සභාව කොහොමද එහෙම කියන්නේ.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය கௌரவ நமிந்த அனுரபிரிய*
Hon.Member Naminda Anurapriya-------
---------------------------------------------------

ආණ්ඩු පක්ෂය. අපේ කණ්ඩායම. අපේ ජනතාව. සබරගමුවේම ජනතාව කියන්නේ. හැබැයි එක්සත් ජාතික පක්ෂයේ ජනතාව ඒක නෙමෙයි කියන්නේ. ඔබතුමන්ලා විතරයි එහෙම නොකියන්නේ.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර් கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*Hon.Member M.Y.M.Iflar
----------------------------------------

අපි හොරු ආරක්ෂා කරන්නෙ නෑ. අපි තමයි නිවැරදි දේ පෙන්නුවේ. තමුන්නාන්සේලා කෝ කෝප් කමිටුවේ වාර්තාව. කෝ වාර්තා 30 ක්. කෝ. පෙන්නුවාද. තමුන්නාන්සේලා හොරුත් එක්ක හොරකමට ගිහිල්ලා තමුන්නාන්සේලා වංචාවට,දූෂණයට ඉන්න කොට ඒ කරලා දැන් ඇවිල්ලා කතා කරනවා. මුදුනා වගේ.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය கௌரவ நமிந்த அனுரபிரிய*
Hon.Member Naminda Anurapriya-------
---------------------------------------------------

අපි කියන්නේ ඉල්ලා අස් වෙන්න. ඔයගොල්ලන්ට රට කරන්න බෑ. ඉල්ලා අස් වෙන්න. අගමැතිතුමාට. අපේ සබරගමුවේ නෙමෙයි මුළු රටේම ජනතාව කියන්නේ ඉල්ලා අස් වෙන්න කියලා. මේ හොරු ඉන්නේ. යහපාලන රෙද්ද දාගෙන ආපු හොරු. විවාද කරන්න එන්න. (සෝෂාව)

*ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලකගௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*Hon.D.Chairman

*Udayakantha Gunathilaka*---------------------------------------------------------------------------------

ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. සභාව අවසාන වෙන්න තියෙන්නෙ. හතර දෙනෙක් නැගිටලා ඉන්නවා. වාඩි වෙන්න. (සභාවේ ඝෝෂාව)

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** ***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*** *Hon.Member M.Y.M.Iflar* -----------------------------------------

හොරුත් එක්ක ජීවත් වුණ නිසා.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*** ***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*** *Hon.D.Chairman Udayakantha Gunathilaka*---------------------------------------------------------------------------------

පහුගිය සභාවේ මෙවැනි තත්ත්වයක් ආපුවහම මම කිව්වා එහෙම ප්‍රශ්නයක් තියෙනවා නම් ඔයගොල්ලෝත් යෝජනාවක් ගේන්න කියලා. එයාට පහර ගැහීමක් කරලා තියෙනවා නම් ඒකට ගැලපෙන යෝජනාවක්ගෙනල්ලා ඒකට කතා කරන්න අවස්ථාව ලබා ගන්න කියලා කිව්වා. නමින්ද මන්ත්‍රීතුමා කතා කරන කොට මොනවද කතා කරන්නේ කියලා මම දන්නේ නෑ. මේ ලෝකයේම දන්නා කාරණාවක්. මේ ලෝකයේම දන්නා කාරණාව ඔච්චර කියන කොට මම දන්නේ නෑ ඔච්චර රිදෙයි කියලා. මම විරුද්ධ වෙන්නේ කොහොමද. මම දන්නේ නෑ එහෙම කිව්වා නම් මම නම කියන්නේ නැතුව නිකන් ඉන්නවා. මම විරුද්ධ වෙන්නේ කොහොමද මමත් දන්නවා ඔබතුමන්ලාත් දන්නවා මේක ආණ්ඩු පක්ෂයේම පාර්ලිමේන්තුවේම කෝප් කමිටුවේ දීපු වාර්තාවක්

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** ***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*** *Hon.Member M.Y.M.Iflar* -----------------------------------------

අපි තමයි කෝප් වාර්තාව ගෙනල්ලා නිවැරදි විදිහට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවට ගෙනාවේ. තමුන්නාන්සේලාගේ කෝප් වාර්තා 30 ක් කෝ. අඩුම ගනේ කෝප් එකේ සභාපතිටවත් ඉන්න දුන්නද. තර්ජනය කළා එදා. අපි තමයි කෝප් වාර්තාවේ සභාපති ගෙනල්ලා තිබ්බේ. නියම විදිහට විපක්ෂයේ පුද්ගලයෙකුට. සුනිල් හඳුන්හෙට්ටි මැතිතුමාව. තමුන්නාන්සේලා කරන්න දුන්නේ නෑ. එදා හම්බ කළා. අද ඉන්නේ තමුන්නාන්සේලා ඒකාබද්ධ හොරුත් එක්ක. තමුන්නාන්සේලාට පෝෂණය නැති නිසා ඒකාබද්ධ විපක්ෂයත් එක්ක ඉන්න නිසා මේ රට කාලා කාබාසීනියා කරලා අද නැවත ඇවිල්ලා මේ තමුන්නාන්සේලාට ඇවිල්ලා බය වෙන්න එපා අද ජනතාවට බලය දීලා තියෙන්නේ යහපාලනයට තව කල් තියෙනවා. කෙරෙන කොට තමුන්නාන්සේලාට හිතෙයි අපිත් එක්ක එකතු වෙන්න.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*Hon.D.Chairman Udayakantha Gunathilaka*----------------------------------------------------------------------------**

ගරු මන්ත්‍රීතුමන්ලා තමුන්නාන්සේලාට තව පොඩි වෙලාවයි තියෙන්නේ. සභාව කල් තියනවා.

***ගරු මන්ත්‍රී අනුර අලගියවන්න* கௌரவ உறுப்பினர் அனுர அலகியவன்ன*Hon.Member Anura Alagiyawanna* ---------------------------------------**

තමුන්නාන්සේලා නැගිටලා ගියා කියලා ඊයේ රූපවාහිනියේ කියනවා. යූඑන්පී එකේ සාමාජික මන්ත්‍රීවරුන්ගේ ඇමතිවරුන්ගේ විරෝධතාවයට . එදා ෆට් බෝල් තියෙනවා. අපි වෙනුවෙන් කතා කරනවා. අපි කවුරුත් වෙනුවෙන් නෙමෙයි කතා කරන්නේ. හොරු වෙනුවෙන් කතා කරන්නේ. අපිත් හොරු නම්. ඒ පැත්තේත් හොරු නම් හොරු හොරුම තමයි. හොරු අල්ලන්න අවුරුදු දෙකක් දීලා තියෙනවා. තාමත් බැරි වුනා එක හොරෙක් අල්ලන්න. බොරුවට කියන්න ඕනේ නෑ. හොරු අල්ලලා මෙන්න හොරු කියන්න. හොරු අල්ලලා දඩුවම් කරන්න. සුදු හුණු ගාන්න එපා. ඒවා කෙරෙන්න ඕනේ.

***ගරු නි.සභාපතිඋදයකාන්ත ගුණතිලක*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*Hon.D.Chairman Udayakantha Gunathilaka*----------------------------------------------------------------------------**

ගරු සභාවෙන් අවසරයි. මෙම ගරු සභාව නොවැම්බර් මස 21 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා. ඒවගේම එදිනට අයවැය යෝජනාව ඉදිරිපත් කරන්න අවශ්‍ය කටයුතු කරන්න සඳහන් කරලා තියෙනවා.

අත්/කළේ :
කංචන ජයරත්න,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පාලිත නානායක්කාර,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2016 ක් වූ නොවැම්බර් මස 17 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.